# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 මැයි 07 වන අඟහරුවාදා**
2013 மே 07 செவ்வாய்க்கிழமை
Tuesday 07th May 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.50 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.50 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.50 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள் ] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිතුමාගේ නිවේදන
## CHAIRMAN’S ANNOUNCEMENTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (1) වගන්තියෙන් ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2013.04.10 දින සිට බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම් වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරියෙකු වන පී.එච්.සී. රත්නායක මහතා පත් කරනු ලැබ ඇති බව ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් සභා ලේකම්වරයා වෙත දැනුම් දී තිබෙනවා."*

*ii*

*"1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (1) වගන්තියෙන් ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ගරු ආණ්ඩුකාරතුමා විසින් බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා බස්නාහිර පළාතේ ඉඩම්, අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් එස්.ටී. කොඩිකාර මහතාව [ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණිය] සිය නිත්‍ය රාජකාරීවලට අමතරව ස්ථිර නිලධාරියෙකු පත් කරන තුරු වහාම ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලද බව 2013.04.19 දිනැති ලිපි පිටපත මගින් සභා ලේකම්වරයා වෙත දැනුම් දී තිබෙනවා."*

*iii*

*"පෙත්සම් කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් කටයුතු කරමින් සිටි ගරු පළාත් සභා මන්ත්‍රී අනන්ද හරිස්චන්ද්‍ර සිල්වා මැතිතුමා සහ ගරු පළාත් සභා මන්ත්‍රී ශ්‍රීනාත් මහේන්ද්‍ර පෙරේරා මැතිතුමා කලින් ලබාගත් අවසරයක් නොමැතිව, කාරක සභාවේ රැස්වීම් තුනකට සහභාගි වී නොමැති බැවින් කාර්ය පටිපාටි රීති 86 (4) අනුව එතුමන්ලාගේ කාරක සභා සාමාජිකත්වය අහෝසි වී ඇති බවත්, එම පුරප්පාඩු සඳහා ඉදිරියේදී පත් කිරීම් සිදු කරන බවත් දැනුම් දෙනවා."*

# ලිපිලේඛනාදිය පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ගරු සභාපතිතුමා, *"මෙම පළාත් සභාවේ කාර්ය පටිපාටි රීති අංක 96 (2) ප්‍රකාරව 2007 - නිවාස සංවර්ධන අරමුදලට අදාළ විගණකාධිපති වාර්තාව මම මෙම සභාවට ඉදිරිපත් කරනවා."*

***එකී විගණකාධිපති වාර්තාව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ලේකම්වරයාට නියෝග කරන ලදී.***
*The Secretary was ordered by the Hon. Chairman to refer the aforesaid Auditor General's Report to the Provincial Public Accounts Committee.*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013.04.23 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that copies of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
# PETITIONS

**** [සභා මේසය මත තබන ලද පෙත්සම]***
*[Tabled petition]*

කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,

දෙහිවල, නැදිමාල, විජිත පාර, අංක 50/4 හි පදිංචි එච්.ඩී. සෝමපාල යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝගය ලැබිණ.***
*Order received to refer the presented-petition to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# ORAL ANSWERS TO QUESTIONS

***න්‍යාය පත්‍රයේ අංක 01 සහ 02 යටතේ මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාගේ නමින් යුත් ප්‍රශ්න ගරු සමූපකාර අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල් බැවින් ප්‍රශ්න ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*The questions in the name of the Hon. Leader of the Opposition, Manju Sri Arangala under item Nos. 01 & 02 of the agenda, was presented to the Hon. Minister of Cooperatives and as two weeks' time was asked for, Hon. Chairman ordered the questions to be referred to the next Council sitting.*

# නොපැමිණ සිටීමේ අවසරය : ගරු නිහාල් ජයවර්ධන
# LEAVE OF ABSENCE: HON. NIHAL JAYAWARDENE

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, "*නිහාල් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් නිවාඩු ලබා දෙන ලෙස*" ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මම මේ කාරණය ඔබතුමාගේ මාර්ගයෙන් ගරු සමූපකාර අමාත්‍යතුමා වෙත යොමු කරන්න කැමැතියි. මේ ලිපිය මා වෙත යොමු කරලා තිබෙන්නේ, එතුමා නියෝජනය කරන මහරගම මැතිවරණ කොට්ඨාශයේ මාකුඹුර ප්‍රාදේශිකයේ ප්‍රාදේශික ලේකම්වරයා. හෝමාගම විවිධ සේවා සමූපකාර සමිතිය මේ රටේ කීර්තිමත් සමිතියක් බවට පත් වුණු සමූපකාර සංගමයක්. ඒක කොයිතරම් ඉහළ මට්ටමට ගියාද කියනවා නම්, ජනාධිපතිතුමා අතින් රන් සම්මාන දිනාගත්තා. පසුගිය කාල පරිච්ඡේදය තුළ ජාත්‍යන්තර සමූපකාර සංගමයෙන් එන විවිධ නියෝජිතයෝ සමූපකාරය පිළිබඳව ලංකාව ඇතුළත අධ්‍යයන කටයුතු කිරීම සඳහා තෝරා ගත්තු සමූපකාරයක් තමයි හෝමාගම විවිධ සේවා සමූපකාර සමිතිය. මේ අන්දමට එහි කටයුතු දීර්ඝ කාලයක් කරද්දී අද වත්මන් සමූපකාර පාලන අධිකාරිය තුළ මේ සමූපකාර සමිතිය විශාල ප්‍රපාතයකට ඇද හැලෙමින් තිබෙනවායි කියන එක අපට පෙනෙන්න තිබෙනවා. ඒ නිසා ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරන්නේ පාරිභෝගික අංශය පිළිබඳවත්, අනෙක් ග්‍රාමීය බැංකු අංශය පිළිබඳවත්, ණය අය කර ගැනීම් පිළිබඳව තිබෙන ස්වභාවය පිළිබඳවත් මම කථා කරන්න යන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මේ වනකොට වර්ෂයක් ඇතුළත ප්‍රාදේශික නවයක් -

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

ඇරපු ගණන කියලා නැද්ද?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම දන්න විධියට එකක්වත් අලුතෙන් නම් ඇරලා නැහැ. නවයක් වැහිලා තිබෙනවා. ගරු ඇමැතිතුමා නියෝජනය කරන මහරගම මැතිවරණ කොට්ඨාශයේ දෙකක් තිබෙනවා. මාකුඹුර බටහිර, මාකුඹුර කියන ප්‍රාදේශික දෙකම වැහිලා. උඩුවන, කටුවාන ප්‍රාදේශිකය වැහිලා. කිරිවේරිය කැලේ - 2 ප්‍රාදේශිකය වැහිලා. ගොඩගම ප්‍රාදේශිකය වැහිලා. රුක්මල්ගම ප්‍රාදේශිකය වැහිලා. මෝටර් රථ අමතර කොටස් ප්‍රාදේශිකය වැහිලා. හෝමාගම විවිධ සේවා සමූපකාර සමිතියේ පාරිභෝගික අංශය, ග්‍රාමීය බැංකු අංශය වාගේම ඉතාම දියුණුවට ලක් වුණු වඩා වැඩි පාරිභෝගික සේවාවක් සලසපු තැනක් තමයි මෝටර් රථ අමතර කොටස් විකිණීමේ මධ්‍යස්ථානය. ඒ නිසා ගරු සභාපතිතුමනි, සමූපකාර ව්‍යාපාරය මේ රටේ පොඩි ජනතාව හදිසියකදී පාවිච්චි කරන තැනක් විධියට අපි නිරන්තරයෙන් හඳුන්වනවා. මේ සමූපකාර සමිතිය ඉතාම දියුණුවට පත් වුණු සමූපකාර සමිතියක්. පසුගිය කාල පරිච්ඡේදය තුළ අවමංගල්‍ය රථ සේවාවක්. කෝප්-සිටි වාගේ පාරිභෝගික අවශ්‍යතා සම්පූර්ණ කරන මධ්‍යස්ථාන ගණනාවක්. ඒ වාගේම ග්‍රාමීය බැංකුත් රටේ තාක්ෂණයත් එක්ක කටයුතු කරන මට්ටමට ගෙනාපු

ආයතනයක්. හොඳ සමූපකාර සමිතියක් විදියට තිබුණු මේ සමූපකාර සමිතියේ අද ගැටළු ගණනාවක් මතු වෙලා තිබෙනවා. මම දන්න විදියට ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමා වෙත යොමු කරන්න කැමැතියි. හෙට වනකොට සමූපකාර සමිතිය සේවක වර්ජනයකට යෙදෙන තැනකට පත් වෙමින් තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ, මේ පිළිබඳව ගරු ඇමැතිතුමාගේ අල්ලපු මැතිවරණ කොට්ඨාශයේ තිබෙන එතුමාටත් සම්බන්ධකම් තිබෙන - මොකද මේ සමූපකාර සමිතියට මහරගම මැතිවරණ කොට්ඨාශයට අයත් ප්‍රාදේශික 16 ක් අයිතියි. ඒ නිසා මේ සමූපකාර ව්‍යාපාරය අද රැක ගැනීම මූලික වගකීමක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි. මේ සමූපකාර අයාලේ යාමට හේතුව අපි පුද්ගලිකව දන්නවා. මේ පිළිබඳව කොමසාරිස්වරුන්ගේ තිබෙන දුර්වල තත්ත්වය. මන්දගාමී ස්වභාවය. හොයන්නේ නැහැ. බලන්නේ නැහැ. තමන්ට නඩත්තු වෙන්න පුළුවන් නම් - ඒ සමූපකාරවලින් නඩත්තු වන මේ ව්‍යාපාරය තුළ ඉහළ අයියලා ඉන්න නිසා මේ සමූපකාර ව්‍යාපාරය දවසින් දවස කඩාගෙන වැටෙනවා. ඒ නිසා අපි ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. ගරු ඇමැතිතුමා පුද්ගලිකව මේ පිළිබඳව හොයලා බලලා හෝමාගම විවිධ සේවා සමූපකාර සමිතියේ වැසී යන ප්‍රාදේශික නවත්වලා මේ සමූපකාරය තිබුණු තැනට ගෙනියන්න අවශ්‍ය කටයුතු කරන්නය කියලා මේ අවස්ථාවේ ඔබතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, ඊළඟ සභා වාරයේදී මේ සම්බන්ධ වාර්තාවක් මම ලබා දීලා ප්‍රගතිය ගැනයි, මේ ප්‍රශ්න දෙකම කියනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ වාහන ආදායම් බලපත්‍ර ගාස්තු පසුගිය දවස්වල වැඩිවීමක් කළා කියන එක අපි පුවත්පත්වලින් දැක්කා. මම හිතන්නේ මේ බස්නාහිර පළාත් සභාව තුළ – විශාල ප්‍රමාණයක් වාහන පාවිච්චි කරන ජනතාවක් ජීවත් වන ප්‍රදේශයක් හැටියට මේ වාහන බලපත්‍ර ගාස්තුව වැඩිවීම පිළිබඳව රටේ ධනය තිබෙන මිනිස්සුන්ට එපමණ ප්‍රශ්නයක් නොවෙයි. නමුත් ගමේ වාහනයක් පාවිච්චි කරන ත්‍රීවිල් රථයට, මෝටර් සයිකලයට, පාසල් දරුවන් අරගෙන යන වෑන් එකට, රාජ්‍ය සේවයේ පොඩි නිලධාරියෙක් ඉඳගෙන අඩු ආදායමක් අනුව ලබා ගත්තු වාහනයට මේ ආදායම් බලපත්‍ර ගාස්තුව වැඩිවීම තුළ දැවැන්ත අසාධාරණයක් මේ බස්නාහිර පළාතේ ජනතාවට සිදු වෙනවා කියන එක ඔබතුමාගේ මාර්ගයෙන් මම ගරු ඇමැතිතුමාට යොමු කරන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, අපි දැක්කා මේ බස්නාහිර පළාත් සභාව තුළ වාහනවල ආදායම් බලපත්‍ර ගාස්තු වැඩිවීමෙන් – පසුගිය පළාත් සභාවේ හිටපු ප්‍රධාන ඇමැතිතුමාත් එදා මේ වාගේ තීරණයක් අරගෙන ඔය වාගේ බලපත්‍ර ගාස්තු වැඩිවීමක් කළා. ඊට පසුව ජනතාවගේ විරෝධයත්, එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රී කණ්ඩායම ඉදිරිපත් කරපු යෝජනාවත් එතුමා සලකා බලලා ඒ වැඩි කිරීම පිළිබඳව මේ බස්නාහිර පළාත පමණක් අරගෙන අනෙක් පළාත් සභාවල මේ වැඩි කිරීම නොකරපු නිසා බස්නාහිර පළාතේ වාහන වෙනත් පළාත්වලට ගිහිල්ලා ලියාපදිංචි කරගෙන ආදායම් බලපත්‍ර අඩුවට ඒ ප්‍රදේශයේ ලබා දෙන නිසා ඒ ගැටළුවට මුහුණ දීලා එදා හිටපු ප්‍රධාන ඇමැතිතුමාට අපි කරපු යෝජනාවත්, ජනතාවගේ විරෝධතාවයත් මැද්දේ එතුමා ඉතාමත් නිහතමානීව කල්පනා කරලා ආපහු එය අඩු කරලා නැවත වාරයක් තිබුණු තත්ත්වයට පත් කළා. මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ රටේ වාහන පාවිච්චි කරන්නේ ධනපති පන්තිය. ඒ අයගේ මිල මුදල් පෙන්වීම සඳහා ලොකු ලොකු වාහන ලබා ගන්නවා. ඒ වාගේම යතුරු පැදි, පසුගිය දවස්වල එන්ජින් ධාරිතාවය 1000 තිබෙන ඒවා ලියාපදිංචි කරන්න මධ්‍යම රජයේ කැබිනට් අනුමැතිය අරගෙන ලංකාවට ගෙනාපු යතුරු පැදි ටික ලියාපදිංචි කරන්න අවසරය දුන්නා. එහෙම නම් ඒ ධනපති පන්තිය ධනය තිබෙනකම පෙන්වන්න වාහන ගන්නවා. මෝටර් සයිකල් අරගන්නවා. නොයෙකුත් සැප වාහන පාවිච්චි කරනවා. නමුත් මේ පළාතේ ජීවත් වන, ත්‍රීවිල් සහ මෝටර් සයිකලයෙන් රැකියාවට යන, ස්වයං රැකියාවක් කර ගන්න ඉතා දුප්පත් අසරණ මිනිස්සුන්ට මේ වාහන බලපත්‍ර ගාස්තුව වැඩිවීම පිළිබඳව ඔබතුමාගේ මාර්ගයෙන් අපි එක්සත් ජාතික පක්ෂයත් විපක්ෂයේ කණ්ඩායම ඉල්ලීමක් කරන්න කැමැතියි. නැවත වාරයක් ඒ ගැන සොයලා බලලා මෝටර් සයිකලයට, ත්‍රීවිලයට ඒ වාගේම ගමේ පොඩි වෑන් රථවලින් පාසල්වලට ගෙන යන ළමයින්ගේ වාහනවල ආදායම් බලපත්‍ර ගාස්තුව පහළ දමන ලෙසට ඉල්ලීමක් කරනවා. මේ යෝජනාව ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කරන්න කැමැතියි. එය ක්‍රියාත්මක කරලා බස්නාහිර පළාතේ ආදායම ආරක්ෂා කර ගන්න විදියට වැඩ කටයුතු කරන්නය කියන එක ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා අප්‍රේල් මාසය කියලා කියන්නේ අපේ රටේ සැණකෙළි මාසයක්. සාමාන්‍යයෙන් ජනතාව තෑගි හුවමාරු කර ගන්න, ඒ වාගේම සුභ පතා ගන්න, උත්සව පවත්වන වසන්ත සමයක්. සාමාන්‍යයෙන් ඔබතුමා අහලා ඇති මීට කාලයකට ඉස්සර විශේෂයෙන් මේ රටේ ප්‍රභූ පවුල් වලව් ආශ්‍රිතව පැවත එන කාලේ - අපි අර ගම්පෙරලියේ කයිසාරුවත්තේ මුහන්දිරම්ගේ වලව්වේ අහලා තිබෙනවා වාගේ ජනතාව අවුරුද්දට නෑගම් යනවා වලව්වට තෑගි බෝග ගන්න. මේ සැරේ රාජපක්ෂ වලව්වෙනුත්, මේ ආණ්ඩුවෙනුත් ජනතාවට

මරේ මරු තෑග්ගක් දුන්නා. ඒ තමයි වැඩි කරපු විදුලි බිල. 53% ඉඳලා 100% දක්වා විදුලි බිල වැඩි කරලා, ජනතාවට ලස්සන අවුරුදු තෑග්ගක් දුන්නා. ඒ විතරක් නොවෙයි. සාමාන්‍යයෙන් අපි අහලා තිබෙනවා බක් මහ අකුණු ගැන. මේ සැරේ ස්වභාව ධර්මයෙන් අකුණු නොගැහුවාට ආණ්ඩුව ජනතාව මත හෙණ පථයක් පාත් කළා. ඒ නිසා මුළු රටටම [ ගරු නලින්ද ජයතිස්ස ]

අර්බුදයට ගිහිල්ලා, ජනතාව පීඩාවට පත් වෙලා තිබෙන්නේ. ඔබතුමා දන්නවා සාමාන්‍යයෙන් මේ විදුලි බිල වැඩි කරපු ආකාරය. ගෘහස්ථ පාරිභෝගිකයෝ ලක්ෂ 50 ක් පාවිච්චි කරන්නේ ගිගා වොට් පැය 4161 යි. ඉතුරු 8000 පාවිච්චි කරන්නේ ලක්ෂ 5 කට ආසන්න පාරිභෝගිකයෝ ප්‍රමාණයක්. හැබැයි, මේ ලක්ෂ 50 මත බර පටවලා ලක්ෂ 5 ට අයත් කැසිනෝ කාරයන්ගේ, හෝටල් කරුවන්ගේ, කර්මාන්ත හිමියන්ගේ, මහ පරිමාණ ව්‍යාපාරිකයන්ගේ විදුලි බිලත් ගෙවන්න වෙලා තිබෙන්නේ මේ ලක්ෂ 50 ක් වන පරිභෝගිකයාට. තමුන්නාන්සේ කල්පනා කරලා බලන්න ඒකක 90 ඉඳලා 91 දක්වා වැඩි වනකොට ඒකකයක් සඳහා රුපියල් 1000 ක් ගෙවන්න වෙනවා නම් ඒකක 90 ක් පාවිච්චි කරන්නේ කවුද? මේ රටේ සාමාන්‍ය ජනතාව. රජයේ ලිපිකාරයා වෙන්න පුළුවන්. ගුරුවරයා වෙන්න පුළුවන්. සාමාන්‍ය ව්‍යාපාරිකයා වෙන්න පුළුවන්. ඒ සාමාන්‍ය මිනිස්සු මත ඒකකයකින් රුපියල් 1000 ක් වැඩි කරලා තිබෙනවා. අපි දැක්කා පසුගිය දවස්වල මැයි දිනයේදී ජනාධිපතිවරයා ප්‍රකාශයට පත් කළා (බාධා කිරීමක්) විදුලි බිල අඩු කරනවා කියලා. හැබැයි අද දිවයින පත්තරේ වාර්තා කරලා තිබෙනවා, ඒ ඒකක 60 - ඒ කිව්වේ සම්පූර්ණ බොරුවක්. දැන් මේ රටේ මහින්ද චින්තනය ජනතාව අන්දන චින්තනය බවට පත් කරලා තිබෙනවා. ජනතාව අන්දන චින්තනයට අනුව ඒකක 60 ට වඩා අඩු අයටත් 20% කින් විදුලි බිල නගිනවා. ඒකක 60 ට වඩා අඩු අයට 20% කින් නගිනවා. ඒ විතරක් නොවෙයි. ජනාධිපතිවරයා කිව්වා ඒකක 90 ට වැඩි අයට 96 දක්වා සහනයක් දෙනවා කියලා. 90 සීමාව 96 දක්වා වැඩි කළා කියලා. හැබැයි විදුලි බල මණ්ඩලයෙන් කියනවා එහෙම 96 දක්වා සහනය දෙන්නෙත් අවුරුද්දකට වාර තුනක්ය. ඒත් උත්සව අවස්ථාවල විතරයි කියලා. එතකොට මැයි දිනයේදී ඒ ප්‍රසාදය ලබා ගන්න ජනතාව අන්දවන්න කියපු ප්‍රකාශය දවස් හතක් යනකොට පට්ටපල් බොරුවක් වෙලා තිබෙනවා. මේක වුණේ ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුව අනුගමනය කරන වැරැදි ආර්ථික ප්‍රතිපත්තිය නිසා. මේ විදුලි බිල වැඩි වීමට ජනතාව වග කියන්න ඕනෑ නැහැ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ක ගහපු ගිවිසුම හින්දයි මේක සිද්ධ වුණේ. මූල්‍ය අරමුදලට ආණ්ඩුව පොරොන්දු වුණා විදුලි බිල ඒ වාගේම තෙල් මිල ජනතාව මත පටවනවා කියලා. ඊට අමතරව විදුලි බල මණ්ඩලයේ ක්‍රියාත්මක වන මාෆියාව. මේ දෙකේ එකතුව විසින් තමයි මේ තරම් දුරට විදුලි බිල වැඩි කළේ. ඒ නිසා මෙය කිසිසේත් සාධාරණ නැහැ. ආණ්ඩුවේ ඇමැතිවරුම කියන්න වාගේ, හිටපු විදුලි බල ඇමැතිතුමාම කියන්නා වාගේ මෙය කිසිදු ආකාරයක යුක්ති සහගත, සාධාරණ වැඩි කිරීමක් නොවෙයි. ඒ නිසා අපි බල කරනවා. මෙතරම් විශාල ප්‍රමාණයක් තියෙද්දී ඇමැතිවරුන්ගේ බිල ආණ්ඩුවෙන් ගෙවද්දී ජනතාව මත මේ බර පැටවීම කිසිසේත් සාධාරණ නැහැ. ඒ නිසා මෙයට එරෙහිව ජනතාව උද්ඝෝෂණය -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මැයි 20 වනකොට -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මැයි 20 වන කොට - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාදයකට යන්න අවශ්‍ය නැහැ. ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

කොයි ඇමතිවරුන්ගේද විදුලි බිල -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මොකක්ද රීතිය? ඔය රීතියට අපට කියලා දෙන්න කෝ බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම්වලට බාධා කිරීම් කරන්න එපා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

කරන්න දෙයක් නැහැ. මේ විරෝධය පටන් ගත්තේ මහරගමින් තමයි. මහරගම -

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මැයි 20 වනකොට වැඩ වර්ජනයක් දියත් කරනවා. ඒ නිසා අපි කරුණාකරලා බල කරනවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මේ විදුලි බිල අඩු කරලා ජනතාවට සහන දෙන්න කියලා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න ඕනෑ. මේ ඇමැතිවරු කිව්වාම අපි දන්නේ නැහැ කොයි ඇමැතිවරුද කියලා. අපිත් ඇමැතිවරු. මේකේ පස් දෙනෙක් ඉන්නවා. එතකොට අපේ ලයිට් බිල අපි ගෙවන්නේ අපේ අතින්. මෙතුමාගේ ප්‍රකාශය මාධ්‍යයට යනවා. ඒ නිසා පළාත් සභා ඇමැතිවරුන්ට ඒ වරප්‍රසාදය ලැබෙන්නේ නැහැයි කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක බලලා අවශ්‍ය කටයුතු කරන්නම්. මම බලන්නම්.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු සභාපතිතුමනි, මේ සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට විශේෂ ස්තුතිය පුද කරනවා. මම හිතන්නේ පස්වන පළාත් සභාවේ ඉතාමත් වැදගත් වුත්, ඉතාමත් ඓතිහාසික වුත්, ඉතාමත් සමාජ සත්කාරක කාරණාවක් වූ ඒ සරුදම් අරුණැල්ල නමින් ව්‍යාපෘතියක් නිර්මාණය කරලා ඒ සරුදම් අරුණැල්ල ව්‍යාපෘතිය මුළු බස්නාහිර පළාත් සභාවේම සියලුම ආගම් නියෝජනය වන පරිදි, සියලුම ආගම්වල දහම් පාසල්වලට යටිතල පහසුකම් නංවාලීමට මම හිතන්නේ ඒ තේමාව පෙරදැරි කරගෙන ලබා දුන්නු ව්‍යාපෘතියක් වශයෙන් මේ ව්‍යාපෘතිය අපට නම් කරන්න පුළුවන්. මම හිතන්නේ බස්නහිර පළාත් සභාවේ ඉන්න ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විතරක් නොවෙයි, විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ පවා පැසසුමට පාත්‍ර වන, ඔවුන්ගේ පවා ආදරයට පාත්‍ර වන ව්‍යාපෘතියක් වශයෙන් මම හිතන්නේ මේ සරුදම් අරුණැල්ල ව්‍යාපෘතිය අපට නම් කරන්න පුළුවන්. මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මූලිකත්වය අරගෙන කටයුතු කරපු අපේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාට මුළු බස්නාහිර පළාත් සභාවේම සියලු මන්ත්‍රීවරුන්ගේ ප්‍රණාමය මේ අවස්ථාවේදී මුලින්ම පුද කරන්න කැමැතියි කියන එක මේ සභාවේදී මම මතක් කරන්න කැමැතියි.

අපි හිතනවා, මේ ව්‍යාපෘතිය තුළින් බස්නාහිර පළාත් සභාවේ දහම් පාසල් 2409 කට රුපියල් ලක්ෂය බැගින් මිලියන 240.9 ක මුදලක් ලබා දීමට කටයුතු කරන මොහොතේදී කළුතර දිස්ත්‍රික්කයෙන් දහම් පාසල් 766 කුත්, කොළඹ දිස්ත්‍රික්කයෙන් දහම් පාසල් 874 කුත්, ගම්පහ දිස්ත්‍රික්කයෙන් දහම් පාසල් 969 කුත් ලබා ගන්නා මොහොතේදී සමස්තයක් වශයෙන් ගත්තාම බස්නාහිර පළාත් සභාවේ බෞද්ධ දහම් පාසල් 1936 ක් මේ රුපියල් ලක්ෂය බැගින් මුදලක් ලබා ගන්නවා. ඒ වාගේම ඉස්ලාම් දහම් පාසල් 250 ක් රුපියල් ලක්ෂය බැගින් ලක්ෂ 250 ක් ලබා ගන්නවා. ඒ වාගේම ක්‍රිස්තියානි දහම් පාසල් 307 ක් රුපියල් ලක්ෂය බැගින් ලක්ෂ 307 ක් ලබා ගන්නවා. හින්දු දහම් පාසල් 109 ක් ඒ ප්‍රතිලාභ ලබා ගන්නවා. මෙතෝදිස්ත දහම් පාසල් 17 ක් ඒ ප්‍රතිලාභ ලබා ගන්නවා. සමස්තයක් වශයෙන් ගත්තාම මම හිතන්නේ, දේශපාලන ජීවිතය තුළ මම දැකපු ඉතාමත් වැදගත් වුත්, ඉතාමත් හරවත් වුත් සමාජ සත්කාරක ව්‍යාපෘතියක් වශයෙන් මේ ව්‍යාපෘතිය අද රැව් පිළිරැව් දෙන අවස්ථාවක් බස්නාහිර පළාත් සභාවෙන් පෙනෙනවා. මම හිතන්නේ, මේ යෝජනාව තුළ අද අපි දැකලා තිබෙනවා, සියලුම දේශපාලඥයන්ගේ ඇස් මේ පිළිබඳව යොමු වෙලා තිබෙන මොහොතක් කියන එක. බස්නාහිර පළාත් සභාවේ මේ ප්‍රජා සත්කාරක සේවය මම හිතන්නේ අනෙකුත් පළාත් සභාත් අප දිහා බලාගෙන ඉන්න මොහොතක් කියන එක අපි මේ අවස්ථාවේදී දකිනවා.

ඒ නිසා මම හිතන්නේ සමාජය තුළ නොයෙකුත් අකටයුතුකම් සිදු වන මොහොතක, සමාජය තුළ නොයෙකුත් සිදුවීම් සිදු වන මොහොතක අද සමාජය හොඳ පුරවැසියන් බිහි කරන්නට, සමාජයේ පිරිසිදු පුරවැසියන් බිහි කරන්නට මම හිතන්නේ දහම් පාසල් අධ්‍යාපනයේ වැදගත්කම තේරුම් අරගෙන ඒ දහම් පාසල් අධ්‍යාපනය තුළින් හරවත් සමාජයක් රට තුළ නිර්මාණය කරන්නට, බස්නාහිර පළාත් සභාව ආගමෙන් පෝෂණය වුණු සදාචාර සම්පන්න දූ දරුවන් පිරිසක් නිර්මාණය කර ගන්නට මේ ක්‍රියාව ඉතාමත් වැදගත් කාලෝචිත ක්‍රියාවක් කියන එක මේ සභාවේදී නැවත වතාවක් මතක් කරනවා.

ඒ නිසා මම හිතන්නේ මේ වාගේ විශේෂ ව්‍යාපෘති නිර්මාණය කිරීමට බස්නාහිර පළාත් සභාව තුළ ආර්ථික ප්‍රවර්ධන අංශයක් නිර්මාණය කරලා ඒ ආර්ථික ප්‍රවර්ධන අංශය හරහා මේ වාගේ වැදගත් සත්කාර සේවා, ඇස් කණ්ණාඩි බෙදා දීමේ ව්‍යාපෘතියක් නිර්මාණය කළා. ඒක සාර්ථක ව්‍යාපෘතියක් බවට පත් වෙලා තිබෙනවා. සෑම දිස්ත්‍රික්කයකම, සෑම ආසනයකම, සෑම ග්‍රාම සේවා වසමකම ඉන්න සමෘද්ධි ලාභීන් දහ දෙනෙකුට ඇස්

කණ්ණාඩි ලබා දීමේ ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වුණා. මේ වාගේ සෑම දහම් පාසලකටම රුපියල් ලක්ෂ ගණනේ ව්‍යාපෘති ලබා දුන්නා. මේ කර්තව්‍ය නිර්මාණය කරපු අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාටත්, මේ සත්කාරය බල ගන්වමින් ක්‍රියාත්මක වුණු ආර්ථික ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ඉන්න නිලධාරී මහත්වරුන්ටත්, සියලු දෙනාටත් බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු වශයෙන් සියලු දෙනාගේම ප්‍රණාමය පුද කරමින් මගේ වචනය ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා විනාඩි 15 කට තාවකාලිකව අත් හිටුවනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.09 ට යළිත් රැස්විය.***

*Sitting, accordingly suspended until 11.09 a.m. and then resumed.*

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, අපි එනකොට අපේ මේසේ උඩ තිබුණු පොත් ඇදලා තිබුණා. අපේ සියලු බඩු මුට්ටු ඇදලා තිබුණා. මේසේ උඩ තිබුණු පෑන් නැහැ. මේ සම්බන්ධයෙන් ලේකම්තුමා වග කියන්න ඕනෑ. මේ ඔක්කෝම ඇදලා තිබුණා ගරු සභාපතිතුමනි.

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, අපි ලේකම්තුමාගෙන් අහනවා කවුද මේවා ඇද්දේ? මේ අපේ සියලුම පොත්පත් අවුස්සලා තිබුණා. මේසේ උඩ තිබුණු පෑන් නැහැ. ලේකම්තුමාගෙන් අපි අහනවා, කවුද මේකට වග කියන්න ඕනෑ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලේකම්තුමා නොවෙයි වග කියන්න ඕනෑ. මමයි වග කියන්න ඕනෑ. ලේකම්තුමා වග කියන්න අවශ්‍ය නැහැ. මමයි සභාවට වග කියන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මොකක්ද මේ පිළිබඳව කරන්නේ? පෑන් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මම ඒ පිළිබඳව සොයා බලන්නම්. කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. න්‍යාය පත්‍රයට අනුව මීළඟට තිබෙන්නේ, ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කිරීමයි. ඒ සඳහා ගරු සභානායකතුමාට අවස්ථාව.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, සොයා බලනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කොපමණ කාලෙකින් -

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අපි ඔබතුමාගෙන් අහන්නේ අපේ මේ භාණ්ඩ -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම ඉල්ලා සිටිනවා මේ පිළිබඳව ඔබතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හොයලා බලන්නම්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

[සභාවේ සෝෂා]

ගරු සභාපතිතුමනි, මට කරුණාකරලා ඇහුම්කන් දෙන්න. අද න්‍යාය පත්‍රයේ ඊළඟට තිබෙන්නේ මේ සභාවේ අමිල සේවයක් කළ, ඉතාමත් විරෝධාර මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පිළිබඳව ශෝක යෝජනාව. එක්සත් ජාතික පක්ෂයේම මන්ත්‍රීවරු දෙන්නෙක්. චිත්‍රා ඩයස් මැතිතුමා ඒ වාගේම රත්නායක මැතිතුමා. අපි ආණ්ඩු පක්ෂය විධියට සැදී පැහැදී ආවේ පක්ෂය මොකක් වුණත් ඔවුන් පිළිබඳව ගුණ අගයන්න. මේ වැදගත් අවස්ථාවේදී මෙතුමන්ලා හැසිරෙන ආකාරයෙන් අපේ වරප්‍රසාද අහිමි වීමක් වෙනවා. මට අඩ අඩා කථා කරන්න තිබුණු අවස්ථාවක්. මෙතුමන්ලා හිතේ ක්‍රෝධයක් ඇති කළා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මගේ වරප්‍රසාදය ලබා දීලා මේ සභාව සන්සුන් කර දෙන හැටියට ඉල්ලා සිටිනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** – විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ අපටත් වරප්‍රසාද ප්‍රශ්නයක් මතු වෙනවා. ඇත්තෙන්ම එකක් තවම ශෝක යෝජනා මේ සභාවට ඉදිරිපත් වෙලා නැහැ. අපිත් ඒ ශෝක යෝජනාවේදී අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා. චිත්‍රා ඩයස් සහ අනෙක් පළාත් සභා මන්ත්‍රීවරයා පොදු ජනතාව වෙනුවෙන් කටයුතු කළ නායකයෝ දෙන්නෙක්. අද මේ ආණ්ඩුව විදුලි බිලට එරෙහිව ගෙනියන ප්‍රෝඩාකාරී වැඩ පිළිවෙළට ඒ මියගිය මන්ත්‍රීවරුන් දෙදෙනාත් කොහේ හරි ඉඳලා මේ විදුලි බිලට එරෙහිව තමන්ගේ ශක්තිය දෙනවයි කියන එක අපි තමුන්නාන්සේට ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා ශෝක යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු සුනිල් ජයමිණි** – සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ –

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. පාට හතරකින් යුත් මගේ වටිනා පෑනක් මේසේ උඩ තියලා ගියා. මේ පොත්පත් ටික කවුරු හරි ඇදලා. මේ සත්‍ය කථාව. සමහර විට අපේ මුදල් පසුම්බිය තියලා යනවා. වටිනා පොත්පත් තියලා යනවා. මේ ඇත්ත සත්‍ය කථාව. මේක බොරුවක් නොවෙයි. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් උදේ ඒ පෑන පාවිච්චි කළා. මේ පෑන අරගෙන තිබෙනවා. මට කියන්න තිබෙන්නේ මේ සභාවේ වටිනා පොතක් පතක් තියලා අපට බැහැර වෙන්න හම්බ වෙන්නේ නැහැ. කරුණාකරලා කවුරු හරි ගත්තා නම්, ඒ පෑන ආපහු ලබලා දෙන්න.

**ගරු සුනිල් ජයමිණි** – සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, සභාවේ සභානායකවරයා හැටියට මම ඉල්ලීමක් කරනවා. මම හිතන්නේ, එතුමියගේ රුපියල් තිස් දාහක්, හතලිස් දාහක් වටිනා පෑනක් නැති වෙලා තිබෙන්නේ. මේ දැන් නැති වෙලා තිබෙන්නේ. මේ පිළිබඳව වහාම ක්‍රියා මාර්ගයක් ගන්න. නැත්නම් නීතිමය කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම මට අදහස් ප්‍රකාශ කළා එතුමන්ලාගේ බඩු නැති වෙලා කියලා. එම නිසා ලේකම්තුමාට උපදෙස් දෙනවා ඒ පිළිබඳව වහාම සොයා බලා මට වාර්තාවක් ලබා දෙන්න කියලා. ඔබතුමියගේ නැති වූ පැනත් හැකි ඉක්මණින් අපි සොයා දෙන්න උත්සාහ කරනවා.

සුනිල් ජයමිණි ගරු සභානායකතුමාට අවස්ථාව ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කිරීමට

# ශෝක ප්‍රකාශ යෝජනාව I: ගරු ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමා

## MOTION EXPRESSING CONDOLENCES I : HON. R.M.W. RATHNAYAKE , MEMBER

**ගරු සුනිල් ජයමිණි** – සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රථම පළාත් සභාවට එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්ව වසරකට අධික කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද, හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ වියෝව පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed.*

**ගරු සුනිල් ජයමිණි** – සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, 1942 ඔක්තෝබර් මස 05 වන දින දේශීය වෛද්‍යවරයකු ලෙස දොම්පේ ප්‍රදේශයේ කිරිදිවැල, මහල්ඔලුව

ප්‍රදේශයේ පදිංචිව සිටි ආර්.එම්. දොන් සූටින් මහතාගේ සහ එම මහත්මියගේ ආදරණීය පුත්‍රයා හැටියට මෙලොව ජන්ම ලාභය ලැබූ රත්නායක මැතිතුමා සහෝදර සහෝදරියන් තිදෙනෙකුගේ පවුලක සාමාජිකයෙක්. එතුමා කිරිදිවැල මධ්‍ය මහා විද්‍යාලයෙන් සහ නිට්ටඹුව බෞද්ධ විද්‍යාලයෙන් තම අධ්‍යාපනය ලබා තිබෙනවා. සිය පාසල් අධ්‍යාපනයෙන් පසු එතුමා ජාතික ලොතරැයි මණ්ඩලයේ දොම්පේ ආසනයේ අලෙවි නියෝජිතයකු වශයෙන් තමන්ගේ සේවය, රැකියාව ආරම්භ කරමින් වසර පහක් ඒ ප්‍රදේශයේ ව්‍යාපාරිකයකු ලෙස කටයුතු කරමින් සිටි අතරතුරදී තමයි එතුමා 1968 නොවැම්බර් මස 26 වැනිදා විවාහ දිවියට පත් වෙන්නේ. එතුමාට දූ දරුවන් හය දෙනෙක් සිටිනවා. එසේ කාලය ගත කරන අතරතුර තමයි රත්නායක මැතිතුමා දේශපාලනයට පිවිසෙන්නේ. විශේෂයෙන්ම රත්නායක මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ දේශපාලන ක්‍රියාදාමයට තමයි සම්බන්ධ වෙලා හිටියේ.

[ ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා ]

එතුමා ප්‍රිය කරපු, එතුමා ගරු කරපු දේශපාලන පක්ෂය තමයි එක්සත් ජාතික පක්ෂය. එක්සත් ජාතික පක්ෂයේ අත්තනගල්ල ආසනයේ දේශපාලන කටයුතුවල නිරත වුණු එතුමා, එවකට අත්තනගල්ල ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායක සෙනෙවිරත්න මැතිතුමාත් එක්ක ඉතා විශාල දේශපාලන වැඩ පිළිවෙළක් ඒ ප්‍රදේශයේ ක්‍රියාත්මක කර ගෙන ගියා. එසේ දේශපාලන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන අතරතුර එතුමා සෙනෙවිරත්න මැතිතුමාගෙන් පසු යළිත් වරක් දොම්පේ ආසනයේ හිටපු අමාත්‍ය සරත්චන්ද්‍ර රාජකරුණා මැතිතුමාත් සමඟ සම්බන්ධ වෙලා එතුමාත් සමඟ දොම්පේ ආසනයේ අතිදැවැන්ත දේශපාලන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. එක්සත් ජාතික පක්ෂය දොම්පේ ප්‍රදේශය තුළ නඟා සිටුවන්නට එවකට සරත්චන්ද්‍ර රාජකරුණා මැතිතුමාත් එක්ක එතුමා සුවිශේෂී වැඩ කොටසක් කළාය කියන එක ඒ ප්‍රදේශයේ බොහෝ දෙනෙක් දන්නා කාරණාවක්.

විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, එතුමා දොම්පේ මැතිවරණ බල ප්‍රදේශයේ, ආසන බල මණ්ඩලයේ ලේකම්වරයා හැටියට වසර 30 කට ආසන්න කාලයක් කටයුතු කර තිබෙනවා. විශේෂයෙන් ඊටත් වඩා වැඩි කාලයක් එතුමා කිසිම තනතුරක් නොමැතිව, කිසිදු රැකියාවක් නොමැතිව තමන්ගේ මුළු ජීවිත කාලයම පක්ෂය වෙනුවෙන් කැප කරමින් වසර 30 කටත් වැඩි කාලයක් දොම්පේ ආසනයේ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් කැප වෙලා කටයුතු කරපු ගරුකටයුතු මන්ත්‍රීවරයෙක්.

1988 පළාත් සභා මැතිවරණය ආරම්භ වුණේ, මේ රටේ මිනිස්සු මරා ගනිමින් බව අපි දන්නවා. අපේක්ෂකත්වය ලබා ගත් අයට ගෙදර යන්න තිබුණු අවස්ථාව නැති කරමින්, ඉතාමත් භීෂණකාරී මැතිවරණයක් එදා තිබුණේ. එදා ඒ මැතිවරණයට ඉදිරිපත් වෙන්න එක්සත් ජාතික පක්ෂයේ බොහෝ දෙනා බැහැයි කියන වෙලාවක තමයි රත්නායක මැතිතුමා තමන්ගේ ආසනයේ සංවිධායක රාජකරුණා මැතිතුමාගේ ඉල්ලීම පරිදි දොම්පේ ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා හැටියට ඉදිරිපත් වුණේ. අපි දන්නවා, එදා ඒ පැවති ඡන්ද ක්‍රමය තුළ ඒ මැතිවරණයේදී නියම ජන මතය පිළිබිඹු වුණේ නැහැයි කියලා. අපි හැමදාම කියන කාරණයක් ඒක. නමුත් රත්නායක මැතිතුමා කොපමණ ජනතාව අතර හිටියත් එදා ඒ භීෂණයත් එක්ක එතුමාට ජයග්‍රහණය කරන්න අවස්ථාව ලැබුණේ නැහැ. නමුත් ඊට පස්සේ ඒ පැවති ක්‍රමය තුළ කීප දෙනෙකුගේ අභාවයත් සමඟ රත්නායක මැතිතුමාට 1991 වර්ෂයේදී යළිත් පළාත් සභාවට තේරී පත් වෙන්න අවස්ථාව ලැබෙනවා. ඒ නිසා අවුරුදු එකහමාරක පමණ කාලයක් එතුමා පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කරනවා. ඒ කාලය තුළ රත්නායක මැතිතුමා තමන්ගේ දොම්පේ ආසනයට, අත්තනගල්ල ආසනයට ගම්පහ දිස්ත්‍රික්කයට මේ පළාත් සභාවෙන් ලැබෙන මුදල් ප්‍රතිපාදන අරගෙන ගිහිල්ලා, ඒ කටයුතුවලට අවශ්‍ය සියලුම නායකත්වය ලබා දීලා තමන්ගේ සේවය ඉටු කරපු හොඳ මහජන නියෝජිතයකු කියන එක මේ ගරු සභාවේදී මතක් කරන්නට ඕනෑ. ඒ නිසා අද රත්නායක මැතිතුමා අප හැර ගොස් තිබෙනවා. මේ කනගාටුදායක අවස්ථාවේ පළාත් සභාවේ යුතුකමක් වෙනවා, අපේ පළාත් සභාව නියෝජනය කරලා, පළාත් සභාවට විශාල සේවයක් කරලා, පළාත් සභා ක්‍රමය මේ රටේ ස්ථාපිත කරන්න දැඩි වෙහෙසක් දරපු පුද්ගලයන් කිහිප දෙනාගෙන් කෙනෙකු හැටියට අපට රත්නායක මැතිතුමාව නම් කරන්න පුළුවන්. තමන්ගේ යුතුකම් කොටස මනාව ඉටු කරපු මන්ත්‍රීවරයෙක්. ඒ නිසා මේ කනගාටුදායක අවස්ථාවේ අපි බස්නාහිර පළාත් සභාවේ සංවේගය එතුමාගේ පවුලේ සියලු දෙනා වෙත පුද කළ යුතුව පවතිනවා. ඒ නිසා රත්නායක මැතිනිය, ඒ පවුලේ දූවා දරුවන් සියලු දෙනා වෙත බස්නාහිර පළාත් සභාවේ සංවේගය පුද කරමින්, රත්නායක මැතිතුමාට බෞද්ධයන් ලෙස අප බලාපොරොත්තු වන, ප්‍රාර්ථනය කරන ශාන්ත අමා මහ නිර්වාණ සම්පත්තිය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී දොම්පේ ආසනයට මගේ ආදරණීය පියාණන් සමඟ එකට අත්වැල් බැඳගෙන විශාල කර්තව්‍යයක් ඉටු කරපු අපේ හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමාගේ ශෝක යෝජනාවට සම්බන්ධ වීමට හැකිවීම මහත් භාග්‍යයක් කොට සලකනවා. ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමා කිව්වාම දොම්පේ ආසනයේ එතුමාව හඳුන්වන්නේ එක්සත් ජාතික පක්ෂයට දැවැන්ත සේවාවක් කරපු පතාක යෝධයකු හැටියට. මගේ පියාණන් 1977 මැතිවරණයට ඉදිරිපත් වීමටත් ප්‍රථමයෙන්, එක්සත් ජාතික පක්ෂයට අපහසුම කාල පරිච්ඡේදයක් වන 1970 - 1977 කාල සීමාව තුළ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් එතුමා ඒ ගෙන ගිය වැඩ සටහන මම හිතන්නේ, එක්සත් ජාතික

පාක්ෂිකයන් හැටියට අපි කවුරුත් අගය කරන්නට අවශ්‍යයි. එතුමා එක්සත් ජාතික පක්ෂයේ බල මණ්ඩලයේ වසර 30 කට අධික කාලයක් ලේකම් වශයෙන් කටයුතු කළේ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබෙන, එක්සත් ජාතික පක්ෂයට වාසිදායී කාල සීමාවක නොවෙයි. විශාල ගැටළු මැද්දේ, විශාල හිරිහැර මැද්දේ, එක්සත් ජාතික පක්ෂය කෙරෙහි විශ්වාසය තබලා, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් විශාල කර්තව්‍යයක් එතුමා ඉටු කළා. එතුමාගෙන් ආදර්ශයක් ගන්නවා නම් මම හිතන්නේ, එතුමා එක්සත් ජාතික පක්ෂයේ අමාරු කාලයේ, එක්සත් ජාතික පක්ෂයට වාසි කාලයට වඩා දුෂ්කර කාලයේදී එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් කටයුතු කරපු පුද්ගලයෙක්. ඒ වාගේම එතුමා ප්‍රථම පළාත් සභාවට ඉදිරිපත් වුණත්, එතුමාට ප්‍රථම වතාවට පළාත් සභාව නියෝජනය කරන්නට අවස්ථාව ලැබුණේ වසර කිහිපයක් ගත වුණාට පස්සේ. ඒ කාල සීමාව තුළදීත් මෙම පළාත් සභාවේ සෑම වැඩ කටයුත්තකටම සම්බන්ධ වෙලා, මේ පළාත් සභාවෙන් කෙරෙන සියලු සමාජ සේවාවන් ජනතාවට ලබා දෙන්න කටයුතු කරපු මන්ත්‍රීවරයකු හැටියට, පුද්ගලයකු හැටියට එතුමාව අගය කරන්නට අවශ්‍යයි. ඒ වාගේම එතුමාගේ පුත්‍රරත්නය, කුමාර රත්නායක ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීතුමා ප්‍රාදේශීය සභා ක්‍රමය ආරම්භ කරපු දිනයේ ඉඳන්ම එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරලා, ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයකු හැටියට මේ වනතුරුත් විශාල සේවාවක් ජනතාව වෙනුවෙන් ඉටු කරනවා. ඒ අනුව එතුමාගේ මුළු පවුලේම ශක්තිය දේශපාලනයටත්, සමාජ සේවාවටත්, ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ අභිවෘද්ධියටත් කැප වුණු පවුලක් හැටියට, සමාජ සේවකයන් හැටියට අපි නම් කරන්න ඕනෑ. ඒ වාගේම ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමාගේ ආදරණීය බිරිඳ ග්‍රාම නිලධාරිනියක් වශයෙන් වසර ගණනාවක් තමන්ගේ බල කොට්ඨාශයට දැවැන්ත සේවාවක්, සමාජ සත්කාරයක් ඉටු කරනු ලැබුවා. ඉතින් ඒ සියලුම දෙනා විශේෂයෙන් ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක හිටපු පළාත් සභා මන්ත්‍රීතුමා, ඒ වාගේම එතුමාගේ ආදරණීය බිරිඳ, පුතණුවන්, දූ දරුවන් සියලුම දෙනා දොම්පේ ආසනයට විශාල සේවාවක් සිදු කරපු පවුලක් හැටියට සිහිපත් කරන්න ඕනෑ. එතුමාගේ ඒ දැවැන්ත ශක්තියෙන් දොම්පේ ආසනයේ තරුණ තරුණියන්ට රැකී රක්ෂා උදා කර දෙන්න, ප්‍රදේශයේ නොයෙකුත් සංවර්ධන කටයුතුවලට එතුමා මූලිකත්වය අරගෙන කටයුතු කළා.

විශේෂයෙන්ම තමන්ගේ ප්‍රදේශයේ ආගමික සිද්ධස්ථානවලට විශාල දැවැන්ත සේවාවක් එතුමාත්, එතුමාගේ ආදරණීය සහෝදරයාත් - දැන් මාසයකට කලින් ප්‍රේමරත්න රත්නායක මැතිතුමාත් අභාවප්‍රාප්ත වුණා. එතුමාත් මේ රත්නායක සහෝදරයින් දෙදෙනාම එකතුව විශාල ආගමික, සාමාජික සේවාවක් දොම්පේ ආසනය තුළ ඇති කළා. විශේෂයෙන් එතුමාගේ අවසාන කාල වකවානුවේදී පවා. මාගේ ආදරණීය පියාණන් සමඟ වසර 35 කට අධික කාල සීමාවක් එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් විශාල දැවැන්ත කටයුත්තක් කළා. මම දොම්පේ ආසනයේ සංවිධායකත්වය භාර ගත්තාට පස්සෙත් තමන්ගේ අසනීප කාල වකවානුවේදී වුණත් එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් මාත් සමඟ දැවැන්ත මෙහෙයක්, මහන්සියක්, කැප කිරීමක් එතුමාගේ ඒ අවසාන කාල පරිච්ඡේදයේත් සිදු කළා. මට මතකයි එතුමා අභාවප්‍රාප්ත වීමට සතියකට කලින් එක්සත් ජාතික පක්ෂයේ දොම්පේ ආසනයේ බල මණ්ඩලය පිහිටුවන අවස්ථාවටත් එතුමා සහභාගී වෙලා, එතුමා දොම්පේ ආසනයේ එක්සත් ජාතික පක්ෂ බල මණ්ඩලයේ උප සභාපතිවරයා වශයෙනුත් තේරී පත් වුණා. එතුමාගේ ඒ අවසාන දේශපාලන කථාව සිදු කළේ එදා ඒ බල මණ්ඩල රැස්වීමේදී. එහෙම නම් මෙම දැවැන්ත සමාජ සේවකයාට, මෙම පළාත් සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරයාට. මුළු ජීවිතයම සමාජ සේවයට කැප කරපු පුද්ගලයකු හැටියට එතුමාට මෙම පළාත් සභාවේ ශෝකය ඉදිරිපත් කරන අවස්ථාවේදී දොම්පේ ආසනයේ එක්සත් ජාතික පක්ෂ බල මණ්ඩලයේ ශෝකයත්, එක්සත් ජාතික පක්ෂයේ ශෝකයත්, මාගේ පෞද්ගලික ශෝකයත් ඉදිරිපත් කරමින් එතුමාට නිවන් සැප ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමාගේ ශෝක යෝජනාව ගෙන ඒමට අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ඇත්තටම අපේ ගරු සභානායක සුනිල් ජයමිණි මැතිතුමාත්, අපේ එක්සත් ජාතික පක්ෂයේ මගේ සහෝදර පළාත් සභා මන්ත්‍රී දොම්පේ ආසනයේ ප්‍රධාන සංවිධායක හර්ෂණ රාජකරුණා මැතිතුමාත් ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමා සම්බන්ධව එතුමාගේ ජීවිතය, ඒ වාගේම එතුමාගේ දේශපාලනය, ඒ වාගේම එතුමාගේ සමාජ සේවය සම්බන්ධව දීර්ඝ වශයෙන් අදහස් ප්‍රකාශ කළා. මම දීර්ඝ වශයෙන් අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු නොවුණත්, එතුමා වෙනුවෙන් කථා කිරීම යුතුකමක් ලෙසයි මම දකින්නේ. එයට හේතු ගණනාවක් තිබෙනවා. පළමුවැනි පළාත් සභාව කියලා කියන්නේ - 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කරපු පළාත් සභා ක්‍රමය තුළ පළමු පළාත් සභා මැතිවරණයට මුහුණ දීම ඓතිහාසික අවස්ථාවක් හැටියටයි මම දකින්නේ. එදා පළාත් සභාවට ඉදිරිපත් වෙන්න අපේ පක්ෂයේවත්, ඒ වාගේම මහජන පක්ෂයේවත් බොහෝ උදවිය ඉදිරිපත් වීමට පසුබෑ අවස්ථාවේ නිර්භීත උදවිය ඉදිරිපත් වුණා. ඒ එක්කෙනෙක් තමයි රත්නායක මැතිතුමා. මම පෞද්ගලිකව දන්නවා. භීෂණ සමයේදී එතුමාට යම් යම් තර්ජන ආවා. ඡන්දය ඉල්ලන්න එපා කිව්වා. ඡන්දය ඉල්ලන අවස්ථාවේත් යම් යම් ප්‍රශ්න ආවා. මේවා දැන ගන්න හේතු ගණනාවක් තිබෙනවා. මගේ පියා වන යූ.එස්. පෙරේරා මැතිතුමාත් පළමු වැනි පළාත් සභාවට ඉදිරිපත් වෙලා ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමා සමඟ ළඟින් ආශ්‍රය කරපු කෙනෙක්. අපගේ නිවසට මෙතුමා පැමිණෙන අවස්ථාවලදී අපට ආශ්‍රය කරන්න අවස්ථාව ලැබුණා.

ඒ වාගේම පළාත් සභා කාලය මැදදී පළාත් සභාවට පත් වුණත්, ඉතාම ළඟින් ආශ්‍රය කරපු මන්ත්‍රීවරයකු වශයෙන්, රත්නායක

මැතිතුමාගේ හොඳ ගති ගුණ දන්නා මන්ත්‍රීවරයකු වශයෙන් මම අගය කරනවා. මේ අවස්ථාවේ මේ බස්නාහිර පළාත් සභාව මේ යෝජනාව ගෙනැල්ලා ඒ පවුලට, ඒ ගමට, ප්‍රදේශයට, දිස්ත්‍රික්කයට, ආසනයට යුතුකම් ඉටු කිරීම සම්බන්ධව බස්නාහිර පළාත් සභාවට අපේ ස්තූතිය අපි ප්‍රකාශ කරන්න ඕනෑ. ඇත්තටම ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමා අපේ එක්සත් ජාතික පක්ෂයේ හිටපු දිවංගත සරත්චන්ද්‍ර රාජකරුණා මැතිතුමාව ඉතාමත් ළඟින් ආශ්‍රය කරපු පුද්ගලයා කිව්වොත් ඒක වැරදි නැහැ. එතුමාගේ ආදරණීය පුත්‍ර රත්නය දැන් කථා කළා. ඇත්තටම එදා එක්සත් ජාතික පක්ෂයේ බල මණ්ඩලයේ ලේකම් වෙලා, උප සභාපතිවරයා වෙලා අවසානය දක්වා එක්සත් ජාතික පක්ෂයට කටයුතු කරපු ආකාරය අපි දකිනවා. දොම්පේ ආසනයට ඒ ශක්තිය ලබා දුන් ආකාරය අපි දකිනවා. ඒ විතරක් නොවෙයි සමූපකාර ක්ෂේත්‍රය තුළ අසාධාරණයට විරුද්ධව එතුමා දැවැන්ත විධයට හඬ නැගුවා. ඒ වාගේම අසාධාරණ වංචාවලට විරුද්ධව. මම දකිනවා, මගේ පියා සමඟ අදහස් හුවමාරු කර ගත් ආකාරය. ඒ වාගේම මට අමතක නොවන

[ ගරු යූ. ජෝර්ජ් පෙරේරා – විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ]

සිද්ධියක් තිබෙනවා. මගේ පළාත් සභා ඡන්දයක් දවසකදී, ඡන්ද වෙලාවකදී මගේ නිවසට ඇවිල්ලා මගේ පියා හමුවෙලා මගේ පියාට සලකන්න ඕනෑ කියලා මගේ ඡන්ද දැන්වීම් පත්‍රිකා 100 ක් පමණ අරගෙන ගිහිල්ලා අපට උදව් උපකාර කරපු ආකාරය මට අමතක වෙන්නේ නැහැ. එම නිසා හොඳ ගතිගුණ තිබෙන, දක්ෂ, නිහතමානී පුද්ගලයකු තමයි අපේ ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමා. එතුමාගේ දේශපාලන අභිලාශය දැන් එතුමාගේ ආදරණීය පුතා වන අපි කවුරුත් දන්නා හඳුනන, පුෂ්පකුමාර රත්නායක මැතිතුමා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කරන ආකාරය අපි දකිනවා. ඉතා දක්ෂ ආකාරයට පරදින්නේ නැතිව හොඳ ගමනක් ගියා. ජනතාවට සමාජ සේවා කටයුතු වෙන්න පුළුවන්. අධ්‍යාපනය වෙන්න පුළුවන්. ඒ වාගේම සංස්කෘතික වෙන්න පුළුවන්. දේශපාලන වශයෙන් ඒ ගමට ශක්තියක් දෙන ආකාරය අපි දකිනවා. ඒ තාත්තාගේ අඩිපාරේ ගිහිල්ලා ඒ ගමන අද එතුමා ගෙන යාම සම්බන්ධව ඇත්තටම අද අපි සතුටු වෙන්නට ඕනෑ. එම නිසා මම දීර්ඝ වශයෙන් අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. එම නිසා අපේ රත්නායක මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා අපි කවදත් කරනවා වාගේම ඒ පවුලේ සියලුම දෙනාට මේ හැන්සාඩ් වාර්තාව යවලා අපේ ශෝකය පළ කරන්න කියලා ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිවංගත හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ඉදිරිපත් වුණු ශෝක යෝජනාව පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාව මෙයින් අවසන් වෙනවා. අදහස් ප්‍රකාශ කරපු ගරු සභා නායකතුමාටත්, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාටත්, හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමාටත් මම ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමා මම දේශපාලනය ආරම්භ කරපු ගම්පහ දිස්ත්‍රික්කයේම අපට පෙරාතුව ඉතාමත්ම භීෂණකාරී යුගයක දේශපාලනයට අවතීර්ණ වෙලා, බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් වෙලා, එම පළාත් සභාව තුළ ගම්පහ දිස්ත්‍රික්කයට, විශේෂයෙන්ම දොම්පේ ආසනයට විශාල සමාජ මෙහෙවරක් කරපු මන්ත්‍රීවරයකු වශයෙන් අපි දැන හඳුනාගෙන සිටියා. ඒ වාගේම එතුමා දේශපාලනය තුළ බොහොම නිහතමානීව කටයුතු කළ මන්ත්‍රීවරයකු බවත් අපි හොඳාකාරවම දන්නවා. එතුමා දේශපාලනයෙන් කවදාවත්ම උදම් වුණු, ආඩම්බර වුණු මන්ත්‍රීවරයකු නොවෙයි. සාමාන්‍ය මිනිස්සුත් එක්ක බොහොම ළෙන්ගතුව ආශ්‍රය කරපු, දොම්පෙට ආදරය කරපු, විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්යේ සියලුම එක්සත් ජාතික පාක්ෂිකයින්ට ඉතාමත්ම හොඳින් ආදරය කරපු මන්ත්‍රීවරයකු වශයෙන් අපි දැන හැඳිනගෙන තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී බස්නාහිර පළාත් සභාවේ සභාපතිවරයා වශයෙන් මගේ පෞද්ගලික ශෝකයත්, අපේ පවුලේ ශෝකයත් දිවංගත ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමාගේ ආදරණීය බිරිඳ ඇතුළු ඒ දරුවන්ට මේ අවස්ථාවේදී පුද කර සිටිනවා. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම ගරු අමාත්‍යවරුන්ගේත්, අදහස් ප්‍රකාශ කළත්, නොකළත් සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ ශෝකය, කනගාටුව ප්‍රකාශ කර සිටිනවා. මම මේ අවස්ථාවේදී ඒ වෙනුවෙන් ශෝකය පළ කරමින් කථා කරපු ඒ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් ඇතුළත් නිල වාර්තාවේ පිටපතක් ඒ පවුලේ ඥාතීන්ට ලැබෙන්නට සලස්වන ලෙස මම ලේකම්තුමාට උපදෙස් දෙනවා. අවසාන වශයෙන් විශාල දේශපාලන මෙහෙවරක් කරපු ආර්.එම්.ඩබ්ලිව්. රත්නායක මැතිතුමාට අපි කවුරුත් ප්‍රාර්ථනා කරන අජරාමර නිවන් සුව අත්වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් එම ශෝක යෝජනාව පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීම මෙයින් අවසන් කරනවා.

මීළඟට හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කළ එස්. චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට මම ගරු සභා නායකතුමාට ආරාධනා කරනවා.

# ශෝක ප්‍රකාශ යෝජනාව II: ගරු එස්. චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා

MOTION EXPRESSING CONDOLENCES II : HON.S. CHANDRASIRI DIAS, MEMBER

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාත් සභාවේ තෙවන පළාත් සභාවට එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් වී*

*වසර පහක් මෙම පළාත් සභාවට අතිමහත් සේවයක් කරපු හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී එස්. චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව එතුමා ඉටු කරන ලද සේවය අගය කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය මේ අවස්ථාවේදී පළ කර සිටී"* යන ශෝක ප්‍රකාශ යෝජනාව මම ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, 1946 ජූලි මාසේ 26 වැනිදා කොළොන්නාවේදී චාල්ස් ඩයස් මැතිතුමාට සහ ආර්.ඒ. ලීලාවතී මහත්මියට දාව උපත ලැබූ චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා සහෝදර සහෝදරියන් හතර දෙනෙකුගේ පවුලේ සාමාජිකයන් ලෙස කටයුතු කරන අතර, එතුමා කුඩා කාලයේ කොළොන්නාව ප්‍රදේශයේ හැදී වැඩී කොළොන්නාව ටෙරන්ස් ද සිල්වා විද්‍යාලයෙන් සහ මරදාන ස්ටැෆර්ඩ් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා තිබෙනවා. ඒ අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ පරීක්ෂකවරයකු ලෙස කලක් රැකියාව කරලා, ඉන් පසුව එතුමා ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරියකු ලෙස කාලයක් සේවය කිරීමෙන් අනතුරුව 1970 දෙසැම්බර් මාසේ එතුමා කිරිඳිවැල, මණ්ඩාවල ප්‍රදේශයේ අපේ ආර්.එල්. පෙරේරා මැතිතුමාගේ සහ නන්දාවතී මහත්මියගේ ආදරණීය දියණිය වන සිරිමා හපුආරච්චි මෙනෙවිය සමඟ විවාහ වුණා. එතුමා දියණියකගේ සහ පුතෙකුගේ ආදරණීය පියතුමකු ලෙසින් මෙලොව ජීවත් වීමට වාසනාව ලැබුවා. චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා 1979 වර්ෂයේදී එවකට කොළොන්නාව ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායක, ඒ වාගේම කොළොන්නාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙස කටයුතු කරපු වීරසිංහ මල්ලිමාරච්චි මැතිතුමාත් සමඟ දේශපාලනයට සම්බන්ධ වෙලා, පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වෙන්නේ කොළොන්නාව නගර සභාවටයි. චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා ප්‍රදේශයේ ජනප්‍රිය දේශපාලන චරිතයක් බවට පත් වෙලා කොළොන්නාව නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයකු ලෙස 1979 දී තේරී පත් වෙනවා. ඉන් පසුව එතුමා නගර සභාවේ මන්ත්‍රීවරයකු හැටියට කාලයක් කටයුතු කරනවා. ඒ වකවානුව තුළ 1983 - 1988 කාලයේ නගර සභාවේ උප සභාපතිවරයා හැටියටත්, 1988 - 1989 කාලයේ නගර සභාවේ සභාපතිවරයා හැටියටත් චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා කොළොන්නාවේ ජනතාවට තමන්ගේ සේවය ලබා දෙනවා. ඉන් පස්සේ 1999 දී තෙවන පළාත් සභා මැතිවරණය සඳහා එතුමා එක්සත් ජාතික පක්ෂයෙන් නාම යෝජනා ලබා ගෙන, කොළඹ දිස්ත්‍රික්කයේ අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වෙනවා. එතුමා ඒ මැතිවරණය ජයග්‍රහණය කරලා, බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට තේරී පත් වෙනවා. ඉන් පස්සේ නැවතත් එතුමා පළාත් සභාවෙන් ඉවත් වීමත් සමඟ 2006 දී යළිත් කොළොන්නාව නගර සභාවේ නගරාධිපතිවරයා වශයෙන් පත් වෙනවා. 2011 සිට මිය යන තෙක් එතුමා කොළොන්නාව නගර සභාවේ විපක්ෂ නායකවරයා හැටියට කටයුතු කරමින් සිටියා. ඒ නිසා චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා නාගරික මන්ත්‍රීවරයකු හැටියට, නගර සභාවේ උප සභාපතිවරයා හැටියට, නගර සභාවේ සභාපතිවරයා හැටියට, ඒ වාගේම කලක් පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට, ඒ වාගේම අවසාන භාගයේ නගර සභාවේ විපක්ෂ නායකවරයා හැටියට තමන්ගේ දායකත්වය කොළොන්නාවේ ජනතාව වෙනුවෙන් ලබා දුන්නා. 1979 දී නගර සභාවෙන් දේශපාලනයට පිවිසි එතුමා නගර සභා බල ප්‍රදේශය තුළත් තමන්ට කරන්න පුළුවන් වැඩ කොටස බොහොම ඉහළින් ඉටු කළාය කියන එක තමයි ඒ ප්‍රදේශයේ ජනතාව සඳහන් කරන්නේ.

මම විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. කොළොන්නාව නගර සභාවේ මහජන පුස්තකාලය, කොළොන්නාව නගර සභාවේ සිහිති උයන, කොම්පෝස්ට් අංගනය, කොළොන්නාව සුසාන භූමියේ අවමංගල ශාලාව ඉදි කිරීමට එතුමා මුල් වෙලා කටයුතු කළාය කියන එක කොළොන්නාව ජනතාව ඉතා හොඳින් දන්නා කාරණාවක්. ඉන් පසුව කොළොන්නාව ප්‍රදේශයේ සනීපාරක්ෂක පහසුකම් ඇති කරන්නට එතුමා තමන්ගේ නගර සභාවට නායකත්වය ලබා දෙමින් ඒ කටයුතුවලට අවශ්‍ය දායකත්වය ලබා දුන්නා. විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ. චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා බස්නාහිර පළාත් සභාවේදී තමයි අපිත් එක්ක සම්බන්ධ වෙන්නේ. බස්නාහිර පළාත් සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට එතුමා මේ පළාත් සභාවට ආවාට පස්සේ, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ අයත් සමඟ, විපක්ෂයේ අයත් සමඟ බොහොම ළඟ සම්බන්ධයක් පැවැත්වූ මන්ත්‍රීවරයෙක්. අපට මතකයි එතුමා මේ පළාත් සභාවෙන් සම්බන්ධ වන විදේශ චාරිකාවලදී, එහෙම නැත්නම් දේශීය වශයෙන් පැවැත්වෙන වැඩමුළුවලදී, පුහුණුවීම්වලදී සෑම අවස්ථාවකටම තමන්ගේ දායකත්වය ලබා දුන්නා. ඒ වාගේම හැම විටම මන්ත්‍රීවරුන් එක්ක සුහදත්වයෙන් කටයුතු කළා. අර තමන්ගේ මනුස්සකම සමාජයට කියලා දෙන්න උත්සාහ ගත්තු මනුස්සයෙකු හැටියටත් අපට එතුමාව හඳුන්වන්න පුළුවන්. ඒ නිසා චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා තමන්ගේ ජීවිත කාලය තුළ මේ සමාජයට බොහෝ සේවයක් ඉටු කරපු මනුස්සයෙක් හැටියටයි අපි දකින්නේ. ඒ නිසා එතුමා පිළිබඳව මම විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. කොළොන්නාව ප්‍රදේශය තුළ එක්සත් ජාතික පක්ෂය නගා සිටුවන්න එවකට හිටපු වීරසිංහ මල්ලිමාරච්චි ඇමතිතුමාත් එක්ක, ඇමතිතුමාගේ අභාවයෙන් පස්සේ අනෙකුත් නායකයන් සමඟ එකතු වෙලා ඒ තමන්ගේ යුතුකම් කොටස තම පක්ෂය වෙනුවෙන් ඉටු කළාය කියන එක අපි විපක්ෂයේ හිටියත් අපි හොඳින් දන්නා කාරණයක්. ඒ නිසා පක්ෂයටත්, ප්‍රදේශයේ ජනතාවටත්, තමන්ගේ පවුලේ සියලු දෙනාටත් බොහෝ සේ උපකාර කළ මහත්මා ගති ඇති කෙනෙක්. ඒ නිසා මේ කනගාටුදායක අවස්ථාවේ අපේ පළාත් සභාවේ යුතුකමක් තිබෙනවා. පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කරපු එතුමාට අපේ සංවේගය පළ කිරීමට කටයුතු කිරීම. ඒ නිසා බස්නාහිර පළාත් සභාවේ අවුරුදු පහක් අඛණ්ඩව මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කරලා, මේ පළාත් සභා ක්‍රමය මේ රටේ ස්ථාපිත කරන්නට විශාල කැප කිරීමක් කරපු චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාට බෞද්ධයන් ලෙස අපි ප්‍රාර්ථනය කරන ශාන්ත අමාමහ නිර්වාණ

සම්පත්තිය මේ සසර අවසානයේදී අත්වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

### ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, අද මේ සුවිශේෂී අවස්ථාවේදී ඉතාමත්ම අපහසුවෙන් මේ සභාවට මම ආවේ, මගේ ණය යුක්තියක් ඉෂ්ට කරන්නයි. ඒ මොකද, මේ පළාත් සභාවේ 1999 ඉඳලා අවුරුදු පහක් මගේ වම් අත පැත්තේ වාඩි වෙලා හිටපු මගේ සහෝදර මන්ත්‍රීවරයා, ඊටත් පෙර පළාත් පාලන ක්ෂේත්‍රයේදී මම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයකු හැටියටත්, චන්ද්‍රසිරි ඩයස් එහෙම නැත්නම් මගේ කටට හුරු චිත්‍රා කොළොන්නාවේ නගර සභාවේ සභාපතිවරයා හැටියටත් හිටපු කාලයේ සිට අපේ ඒ තිබුණු දීර්ඝ මිත්‍රත්වය නිසාම ඔහු වෙනුවෙන් අද මේ බස්නාහිර පළාත් සභාවේ ශෝකය පළ කරන අවස්ථාවේදී මගේ වචන ටික ඔහු වෙනුවෙන් පූජා කරන්න බැරිව ගියොත් මම හිතනවා මම විශාල ගුණමකුකමක් කළාය කියලා. චන්ද්‍රසිරි ඩයස් මන්ත්‍රීතුමා

[ ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා ]

දේශපාලඥයකු කියන වචනය පාවිච්චි කරනවාට වඩා, මම කැමතියි ඔහු ඇත්ත වශයෙන්ම සාමාන්‍ය පොදු ජනතාවත් එක්ක හැදුණු, වැඩුණු, ගැටුණු, එකට ජීවත් වුණු මහජන සේවකයෙක් කියන වචනය පාවිච්චි කරන්න. චිත්‍රා පළාත් පාලනයට කොපමණ ආදරේද කියලා එතුමාව ආශ්‍රය කරපු, විශේෂයෙන්ම එතුමාගේ සේවය ලබපු කොලොන්නාවේ නගර සභා සීමාවේ ජනතාව හොඳටම දන්නවා. මට එතුමාව කිට්ටුවෙන් ආශ්‍රය කරන්න ලැබුණේ, 1999 තුන්වන පළාත් සභාවට තේරී පත් වෙලා ආවාට පස්සේ. ඒ කාලේ සභාව තිබුණේ සචිසිරිපායේ. ඔබතුමාට මතක ඇති. පිටිපස්සේම පේළියේ අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා, රත්නසිරි රාජපක්ෂ මැතිතුමා, ඊළඟට චිත්‍රා ඩයස්, ඊළඟට මම, ඊළඟට ජෝෂප් චාල්ස්, ඊළඟට ජනතා විමුක්ති පෙරමුණේ විජිත හේරත්, සිරිපාල අමරසිංහ ඇතුළු මන්ත්‍රීවරු පේළිය තමයි එකට හිටියේ. අවුරුද්දක් දෙකක් යන කොට ඒ ඉන්න හැම අවස්ථාවකම චිත්‍රා නිරන්තරයෙන්ම කිව්වේ, මේ පළාත් සභාවට ඇවිල්ලා මචං මම මේ ගත කරන්නේ අපරාධ කාලයක්. මම මේ ගත කරන්නේ අපරාධ කාලයක්. මම නගර සභවේ මොන තරම් දේවල් කරපු මිනිහෙක්ද? උඹත් දන්නවා ඇති නේ? පළාත් පාලන ආයතනයක මොන තරම් දේවල් කරන්න පුළුවන්ද කියලා. මම මේ අවුරුදු පහ විතරයි ඉන්නේ. මම ආයේ නගර සභාවට යනවයි කියලා, හැමදාම කිව්වා. යම් අවස්ථාවක මෙම පළාත් සභවේ චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාගේ කටහඬ අවදි කරලා තියෙනවා නම්, විශේෂයෙන්ම අයවැය විවාදවලදී වෙන්න පුළුවන්. ඔහු පළාත් පාලනය ගැන තමයි ඒ තමන්ගේ දැනීම් සම්භාරය මේ සභාවට දායාද කළේ. පළාත් පාලන ආයතනයක බදු ගෙවන ජනතාවට උපරිමයෙන්ම සේවය කරන්නේ කොහොමද කියලා - මේවා ගැන කථා කරන්න එච්චර කැමති නැහැ. නමුත් අපට පේන දේ.

ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත්, ගරු සභාපතිතුමනි, ඔබතුමත් පිළිගන්නවා ඇති. අද පළාත් පාලන ආයතනයක සභාපතිවරයෙක් වෙනවා කියලා කියන්නේ, විශාල වරප්‍රසාදයක්. නමුත් එතුමා ඒ තනතුර ආභරණයක් විධියට නොවෙයි. කොහොමද මෙහි අන්තිම සතය දක්වාම කමන්ගේ බදු ගෙවන ජනතාව වෙනුවෙන් සේවය කරන්නේ කියන එක පිළිබඳව තමයි එතුමා කටයුතු කළේ. කොළොන්නාව කියන්නේ දේශපාලන වශයෙන් බොහොම සලකුණු තියෙන මැතිවරණ කොට්ඨාශයක්. මේ සභාව නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ රේණුක පෙරේරා ආණ්ඩු පක්‍ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මොන තරම් මහජනතාවත් එක්ක ගැටෙන සාමාන්‍ය පෙළේ පළාත් සභා මන්ත්‍රීවරු කියලා අපි විශ්වාස කරනවා. කොළොන්නාව මැතිවරණ කොට්ඨාශයේ තිබුණ ටී.බී. ඉලංගරත්න මැතිතුමාගේ සමාජවාදී දර්ශනය පුංචි කාලයේ අපි අහලා තියෙනවා. දැකලා තියෙනවා. ඊළඟට මහජනතාවත් එක්ක නිතර ගැටුණු, මහජනතාවත් එක්ක එකට හැසුරුණු වීරසිංහ මල්ලිමාරච්චි මැතිතුමාත් ඒ කොළොන්නාව මැතිවරණ කොට්ඨාශය නියෝජනය කළ ශ්‍රේෂ්ට ඇමතිවරයෙක්. එතුමාත් එක්ක එකට එකතු වෙලා ඒ ආභාෂය ලබලා, මිනිස්සුන්ට වැඩ කරන්නේ කොහොමද? කොහොමද දුප්පත් මිනිස්සුන්ගේ එදිනෙදා කටයුතු කරන්නේ කියලා චිත්‍රා ඩයස් මැතිතුමා, නැත්නම් චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා අවබෝධය ලබා ගත්තා. ඊළඟට මේ මෑත වකවානුවක බෙනට් කුරේ වගේ බොහොම ජනහිතකාමී මන්ත්‍රීවරු මේ කොළොන්නාව කොට්ඨාශයෙන් බිහි වුණා. අද එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන බොහොම දැන උගත් මේ රටට සේවයක් කරපු කරුණාසේන කොඩිතුවක්කු මැතිතුමා වාගේ ඇමතිවරයෙක් තමයි එක්සත් ජාතික පක්ෂයෙන් කොළොන්නාවේ අදත් සංවිධායක වෙලා ඉන්නේ. ඒ කටයුතු කරන කාලේත් චිත්‍රා ඩයස් මැතිතුමා එතුමාගේ බොහොම සමීපතමයෙක් හැටියට කටයුතු කළා මිස මම හිතන්නේ නැහැ කිසිම දවසක එරෙහිව ගිහිල්ලා කටයුතු කළා කියලා. ඒ තියෙන හික්මීමෙන් යුතුව තමන්ගේ කොට්ඨාශයේ වැඩ කළා. නමුත් අද මේ කථා කරපු නම් එක්ක සියලුම දේශපාලන චරිත කොළොන්නාව අලංකාර කරපු, කොළොන්නාවට ආභරණයක් වුණු චරිත. නමුත් අද කථා කරන කොට කොලොන්නාව වාගේ දහ ජරා දූෂිත දේශපාලනයක් මේ රටට උරුම කරලා, මේ රටේ මැතිවරණ ඉතිහාසයේ කළු පැල්ලම් තියපු කැත නින්දිත දේශපාලනයක් තියෙන කොළොන්නාව වාගේ තැනක චිත්‍රා ඩයස් මැතිතුමාලා මොන තරම් රත්තරන් මිනිස්සුද කියන එක කොළොන්නාවේ ජනතාවට ජීවිත කාලයේම මතක තියා ගන්න මම හිතන්නේ හොඳ අවස්ථාවක්. ඒ නිසා මෙය අවස්ථාවක් කර ගන්න ඕනෑ, මේ නම් කියපු මිනින්සුන්ගේ, මේ නම් කියපු දේශපාලනඥයින්ගේ චරිතවල තිබුණු ඒ වැදගත්කම අර ගෙන චිත්‍රා ඩයස් මැතිතුමාට කරන උපහාරයක් හැටියට, මේ තියෙන දහ ජරා දේශපාලන සංස්කෘතිය, විශේෂයෙන්ම කොළොන්නාවේ මේ තියෙන තුට්ටු දෙකේ දේශපාලනයට තිත තියලා එතුමාට කරන උපහාරයක්

විධියට මේ නව දේශපාලන සංස්කෘතියක් ඇති කරන්න ඕනෑ කියලා මම ප්‍රකාශ කරනවා.

චිත්‍රා ඩයස් මැතිතුමා මේ සභාවේ ඉඳල අවුරුදු පහෙන් පස්සේ ඡන්දය ඉල්ලුවේ නැහැ. එතුමා ගියේ, ආයේ මම යනවා මට පුරුදු තැනට කියලා. මෙතැන තමයි හොඳ. නගර සභාව තමයි සාමාන්‍ය ජනතාවට වැඩ කරන්න හොඳ තැන කියලා ආයෙත් ගිහිල්ලා ඒ නගර සභාව ජයග්‍රහණය කළා. ඒක ඉතිහාසගත වන සිද්ධියක්. 1980 ගණන්වල මුල් කාලයේ ඉඳලා නගර සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් ඉඳලා නගරාධිපති වෙලා, නැවත මේ සභාවට පත් වෙලා පළාත් සභා මන්ත්‍රීවරයෙක් වෙලා, මේ සභාවෙන් අපරාජිතව කොළොන්නාව නගර සභාවට ගිහිල්ලා ආපසු කොළොන්නාව නගර සභාව ජයග්‍රහණය කරලා එහි නගරාධිපති වුණා. මේ අවසාන මැතිවරණයේදී ඒ අන්තිම පැයේදී එදා කොළොන්නාවේ ඇති වුණු වාතාවරණය ඇති නොවෙන්න චිත්‍රා ඩයස් මැතිතුමා තමයි අනිවාර්යයෙන්ම නගරාධිපති වෙන්නේ. ඒක දෛවෝපගත සිද්ධියක් වුණා. චිත්‍රාට ඒ අවස්ථාව නොලැබී ගියා. කොහොම වුණත් අන්තිම දවස් ටිකේ එතුමා බොහොම කනගාටුවෙන් සිටියේ. එතුමාට පහර දුන්නා. එතුමාගේ දේපළ විනාශ කළා. මම හිතන්නේ නැහැ, කොළොන්නාවේ කිසිම කෙනෙක් පක්ෂ විපක්ෂ කිසිම කෙනෙක් චිත්‍රා ඩයස්ට අත තියපු එක අනුමත කළා කියලා. ඒ නිසා මේවා සටහන් කරන්න ඕනෑ දේවල්. චිත්‍රා අන්තිමට අවසාන හුස්ම හෙලුවේ කොහේද? තමන් ආදරය කරපු ඒ නගර සභාවේ මේසය උඩ. හිතන්න. මිනිහෙකුට එහෙම තමන්ගේ පණ තමන් ආදරය කරන තැන දී යනවා කියලා කියන්නේ මොන තරම් ගෞරවයකින්, මොන තරම් ආදරයකින්, මොන තරම් ලැදියාවකින් ඒ නගර සභාවට, ඒ පළාත් පාලන සේවයට තමන් හිටියාද කියන එකයි. එතුමාට උපහාර දක්වපු, එතුමාගේ අවසාන වෙලාවේ ඒ පැමිණි අති විශාල ජනතාව දිහා බැලුවාම දේශපාලනඥයෝ කොහොමද තමන්ගේ ජීවිතය ගත කරන්න ඕනෑ කියලා චිත්‍රා හොඳ ආදර්ශයක් දීලා තියෙනවා. මම මුලින් කිව්ව නම් ටික ඇත්ත වශයෙන්ම - දැන් අපි රේණුක පෙරේරා මන්ත්‍රීතුමා ගැන කථා කළත්, කොළොන්නාවේ ඉන්න අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය ගැන කථා කළත් කවදාවත් කියන්නේ නැහැ මේ මැර දේශපාලනයට සම්බන්ධයි කියලා. ඒ වාගේ තමයි චිත්‍රා ඩයස් කියන්නේත්. මම රේණුකත් එක්ක අශෝකත් එක්ක සහෝදරයෝ වාගේ ජීවත් වුණේ. ඒ නිසා මේ දේශපාලන චරිත ආදර්ශයට ගන්න ඕනෑ. මමත් බොහොම කනගාටුවෙන් මේ පළාත් සභාවේ නිශ්ක්‍රීය කාලයක් මේ ගෙවන්නේ. ඇත්ත වශයෙන්ම කියනවා නම්, අපේ ජීවිතයේ හොඳම කාලය නිකම් මෙහේ ඇවිල්ලා ගත කරනවා. මොනව හරි යෝජනාවක් කථා කරලා, දෙන දෙයක් කාලා වෙන දේ බලා ගෙන ඉන්නවා. අපේ ජීවිතේ අපතේ හැරීමක් මේ කරන්නේ. හැබැයි, මීට වඩා වටිනාකමක් දෙන්න පුළුවන් ආකාරයට චිත්‍රා ඩයස් මැතිතුමාලාගේ ඒ ජීවිත ආදර්ශය අර ගෙන මිනිස්සුත් එක්ක කොහොමද බද්ධ වෙලා කටයුතු කරන්නේ කියන එක මේ සභාවල් ඇතුළට නීති රීති වෙනස් කරලා හරි ගේන්න පුළුවන් නම් මම හිතන්නේ, ඒක තමයි ලොකුම ගෞරවය.

එතුමාගේ ආදරණීය පුත්‍රයා මංජු. මම බොහොම සම්බන්ධයි මේ පවුලත් එක්ක. එක වතාවක් විදේශ ගත වෙන කොට චිත්‍රා මංජුව මට භාර දුන්නේ එක්කගෙන යන්න කියලා. ආදරණීය දියණිය. ඒ වාගේම තමන්ගේ ස්වාමි දුව. තමන්ගේ භාර්යාව නැති වුණාට පස්සේ චිත්‍රා බොහොම කළකිරීමෙන් කාලය ගත කළේ. මොකද? දොම්පේ මණ්ඩාවල ප්‍රදේශයේ ජීවත් වුණාට චිත්‍රාගේ හිත තිබුණේ, කොළොන්නාවේ. උදේට ඇවිල්ලා රෑ වෙන කල් එතැන ඉඳලා තමයි ගෙදර යන්නේ. මම සතියකට අඩුම තරමින් දෙපාරක් තුන්පාරක් කථා කරනවා. කොහොමද දැන්? දැන් කොහෙන්ද කන්නේ? කොහොමද යන්නේ කියලා. නෑ මචං ඒවා ඔක්කෝම හරි. සාමාන්‍ය දේවල් කියලා කියනවා. එහෙම තමයි සාමාන්‍යයෙන් උත්තර දෙන්නේ. ඒ නිසා ඉතා ගුණ යහපත් දරුවෝ දෙන්නෙක් හැදුවා. දුවෙකුයි පුතෙකුයි. මංජු ළඟ තියෙනවා, තාත්තාගේ තියෙන ඒ ගුණ සුවඳ. එක සිද්ධියක් කියලා මම නතර කරන්නම්. අපි හිටපු සව්සිරිපායේ. මම කියපු ඔය නම් පේළියේ අපි වාඩි වෙලා ඉන්න කොට ඔබතුමාට මතක ඇති. ඔබතුමාත් ඒ සභාවේ හිටියා. ජනතා විමුක්ති පෙරමුණේ ඒ කාලේ හිටපු මන්ත්‍රීවරයෙක් යම්කිසි ප්‍රකෝපකාරී කථාවක් චිත්‍රාට කිව්වා. එදා තමයි මම දැක්කේ. පුදුමාකාර විධියට කේන්ති ගියේ. සාමාන්‍ය කෙනෙකුට මේ මයික් එක ඇදලා ගලවලා ගන්න පුළුවන්ද? මීට වඩා ශක්තිමත්. ඉවසන්න බැරුවම ඇදලා ගත්ත ගමන් පහරක් එල්ල කළා. එක පාරයි. දෙවැනි පාර මම පැනලා මටයි වැදුණේ. මම පස්සේ චිත්‍රාගෙන් මැරෙනකල්ම ඇහුවා. උඹ කලකිරීමට පත් වෙන්නේ නැද්ද එදා වුණු සිද්ධිය ගැන කියලා. කවදාවත් නැහැ මචං මම කිව්වා. මම කළේ හරි දේ කියලා එතුමා කිව්වා. ඒ පුද්ගලයින්ගේ චරිත ලක්ෂණ දිහා බැලුවාම දැන් නම් මටත් හිතෙනවා ඒක හරි කියලා. මම ඒ වෙලාවේ අනුමත කළේ නැහැ. නමුත් හැමදාම මම ඇහුවා චිත්‍රා උඹට ඒක ගැන කලකිරීමක් නැද්ද කියලා. ඔබතුමාට මතක ඇති එක් ලක්ෂ ගණනක් ගෙවන්න සිද්ධ වුණා. ලක්ෂ දෙකකට කිට්ටු වෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒක ගෙව්වේ නැහැ කපා හැරියා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නමුත් කිසිම කලකිරීමක් චිත්‍රාගේ හිතේ තිබුණේ නැහැ. කිව්වා, හරි දේ මචං මම එදා කළේ කියලා. හැබැයි, මම ඒක අනුමත කරනවා නොවෙයි. එයාගේ හිතට ආපු ඒ වේගය. එහෙම කෙලින් තීරණ ගත්ත දේශපාලනය හින්දා තඹ සල්ලි අලුක් කාලක් අරගත්තේ නැති, මිනිස්සු විතරක් හම්බ කර ගත්ත ශ්‍රේෂ්ට පුද්ගලයෙක් ගැන තමයි අද අපි කථා කරන්නේ. එහෙම නම් මම

මීට වඩා කථා කරන්නේ නැහැ. ඒ දරුවෝ දෙන්නා. විශේෂයෙන්ම පුත්‍රයා. තමන්ගේ තාත්තාගේ ඒ ගුණ සුවඳ පතුරුවමින් මේ දේශපාලන මඩ ගොහොරුව සුවඳවත් කරන්න පිපෙන්න කියා ආරාධනා කරමින් මම අදහන ආගම අනුව චිත්‍රාට මෝක්ෂ සම්පත්තිය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, අපි ශෝක යෝජනාවක් කථා කරද්දී, ශෝක යෝජනාවක් පිළිබඳව අදහස් දැක්වීමේදී. අපේ යම්කිසි රාමුවක් තියෙනවා ඒ රාමුවෙන් පිට යන්නට මම කොහෙත්ම සූදානම් නැහැ. ඒ නිසා ඒ රාමුව තුළ ඉන්නේ, අපේ සභාව නියෝජනය කළ, අපේ සභාවේ ගෞරවය ආරක්ෂා කළ මහජන නියෝජිතයෙකුගේ ගෞරවය ආරක්ෂා කරන්න. පූර්වාදර්ශයක් හැටියට අපි ඒක හැමදාම රැකපු දෙයක්.

ඒ නිසා ගරු සභාපතිතුමනි, චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාට අපි කවුරුත් ආදරයට කිව්වේ චිත්‍රා කියලා. චිත්‍රා කියන වචනය ඔහුට සම්බන්ධ වුණේ කොහොමද කියන කාරණය මම දන්නේ නැහැ. හැබැයි, ඔහුට කොළොන්නාවේ පොඩි මිනිස්සුත්, මම කියන්නේ

[ ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ]

වයසින් අඩු අයත් චිත්‍රා අයියේ කිව්වා. මිතුරෝ චිත්‍රා කිව්වා. දේශපාලනඥයෙකුට වඩා බොහෝ වෙලාවට ඔහුව තමන්ගේ පෞද්ගලික සහෘදයෙක් හැටියට තමයි, කොළොන්නාව නගර සභා ප්‍රදේශයේ ජනතාව ඔහු වැළඳ ගත්තේ. ඒ නිසාම ඔහු දේශපාලන පොර පිටියට ආපු දා ඉඳලා, මට මතක හැටියට 1981 පළාත් පාලන මැතිවරණය වෙන්නට ඕනැ. එතුමා පළමුව නගර සභා මැතිවරණය ජයග්‍රහණය කරන්නේ. එතුමා එදා සිට ඒ හැම නගර සභා මැතිවරණයකදීම තමන්ගේ කොට්ඨාශ මට්ටමින්, ඒ වාගේම කලින් පවත්වපු, පක්ෂය ජයග්‍රහණය කරලා පක්ෂය විසින් නම් කරන - 81 ඒ ක්‍රමයට තමයි පැවැත්වුවේ. ඒ ක්‍රමය තුළත් ඔහු අඛණ්ඩව නගර සභාව තරග කළත් ජයග්‍රහණය කරන්න පුළුවන් පදනමක් ඔහුට තිබුණා. ඒ ඔහු ජනතාවට සමීප හිතවතෙක් වුණු නිසා. ඇත්තෙන්ම සමහර පුද්ගලයෝ පක්ෂය නිසා ජයග්‍රහණය කරනවා. මම චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාගේ දකින්නේ පක්ෂය ජයග්‍රහණය කළේ චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා නිසා කියලා. මොකද, ඊට හාත්පසින් වෙනස් ප්‍රතිරූපයක් චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා ගොඩනගා ගෙන තිබුණා. ඒක එතුමාට ගෞරවයක් වශයෙන් සටහන් විය යුතු කාරණයක් හැටියට මම දකින්නේ. ඒක දේශපාලනයේ යෙදෙන ඕනෑම අයෙකු මම හිතන්නේ, ආදර්ශයට ගත යුතු තැනක්. පක්ෂය නිසා තමන් ජයග්‍රහණය කරනවාද? තමන් නිසා පක්ෂය ජයග්‍රහණය කරනවාද කියන කාරණය මම හිතන්නේ හරිම වැදගත්. ඒකෙදී චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා නිසා පක්ෂය ජයග්‍රහණය කළා කිව්වොත් නිවැරදියි. ඒ නිසා මම දකින්නේ චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා තමන්ගේ ජීවිත කාලය තුළ තමන්ට ජනතාව පවරපු වගකීම නිවැරදිව ඉෂ්ට කළ දේශපාලන නියෝජිතයෙක් කියන එකයි.

එතුමාට ගෞරවයක් හැටියට විශේෂයෙන් සටහන් කරන්නම අවශ්‍යයි එතුමා හොරෙක් නොවෙයි කියන කාරණය. මොකද? ඒක කට ඇරලා කියන්න පුළුවන් මට්ටමේ එතුමා ජීවත් වුණා. අද දේශපාලනඥයන් ගැන කථා කරන කොට විවිධ අර්ථකථන දෙනවා. සමහරෙක් බොරුවට විවේචනය කිරීම සඳහා තමන් අනෙක් අයව හෙළා දැකීම සඳහා විවිධ ආකාරයට පාවිච්චි කරනවා. හැබැයි අපි චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා තරග කරන මැතිවරණවලදී මම විපක්ෂ වේදිකාවේ චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාගේ පරිපාලනය පිළිබඳව විවේචනය කරපු කෙනෙක්. හැබැයි අපි කොයි වෙලාවකවත් ඒ විවේචනය කිරීමේදී චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා දූෂිතයෙක්, එහෙම නැත්නම් චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා වංචනිකයෙක්, සාමාන්‍ය දේශපාලන සංස්කෘතියේ කථා කරන ශබ්ද කෝෂයේ වචන ඒ චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා පිළිබඳව කථා කරද්දි භාවිතා කරන්න අපට සිද්ධ වෙලා නැහැ. මොකද, ඔහු ඔහුගේ දේශපාලනය ඔහුට ආවේණික කලාවකට හැසිරෙව්වා කිව්වොත් නිවැරැදියි. කොළොන්නාවේ දේශපාලන රටාව සම්බන්ධව සිරිකමල් මන්ත්‍රීතුමා කථා කළා. මම ඒක කොළොන්නාවට විතරක් අදාළ කරන්නේ නැහැ. වත්තල ගත්තත් ඒකත් එහෙම තමයි. අද අපේ සමාජයේ අපි දැකලා තියෙනවා මේක දේශපාලන ස්වභාවය. මේ පවතින තත්ත්වයත් එක්ක දේශපාලන අධිකාරියේ කවුරුත් එක් එක් ආකාරයට ඒ අවස්ථාවේ හැසිරිලා තියෙනවා. හැබැයි, චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාගේ එක දෙයක් තිබුණා. හැමදාම බොහොම ලෙන්ගතුව කථා කළා. බොහෝ වෙලාවට චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා නිතරම කියපු දෙයක් තමයි, මචං උඹ හන්දා මම කී පාරක් අපේ ලොක්කගෙන් බැණුම් අහලා තියෙනවාද කියලා. මොකද, ඔහුට යම් යම් දේවල්, යම් යම් අභියෝගාත්මක අවස්ථාවල අපට විරුද්ධව යමක් කරන්න කියලා පැවැරුවොත් ඔහු ඒ දේ නොකළ බව අපි හොඳාකාරවම දන්නවා. ඔහු තුළ තිබුණා ඒ මනුෂ්‍යත්වය පිළිබඳව යම්කිසි සබැඳියාවක්. ඒ නිසා ඔහු හැම වෙලේම ඔහුගේ දේශපාලනය වාගේම තමන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරගනිමින් මේ කටයුත්ත කරන්න ඔහු පෙළඹුණා.

ඒ වාගේම මම මේ සභාවට ආවාට පස්සේ චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාත් සමග සභාවක කටයුතු කළේ, මේ සභාවේ. හැබැයි, මම දැකපු දෙයක් තමයි චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා පළාත් පාලන විෂය පිළිබඳව පරිණත පුද්ගලයෙක් කිව්වොත් නිවැරදියි. පළාත් පාලන විෂය, ඒ නීති රාමුව පිළිබඳව චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාට පුදුමාකාර දැනුමක් තිබුණා. ඒ නිසා ඔහුට පුළුවන්කමක් තිබුණා ඒ පළාත් පාලන විෂය තුළ, ඒ නීති පද්ධතිය තුළ තමන්ගේ සේවා කාලය තුළ නිවැරැදිව සේවය කරන්න. ඒ නිසා චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාගේ පෞද්ගලික ජීවිතය ගත්තත් එතුමා හොඳ සාර්ථක ජීවිතයක් ගත කරපු කෙනෙක්. යම් යම් අකටයුතුකම්වලට, අසංවර කටයුතුවලට ඔහු නිරත වුණු කෙනෙක් නොවෙයි. ඒ නිසාම අපි දැක්කා ඔහු ඔහුගේ බිරිඳට බොහොම සෙනෙහස

දක්වපු කෙනෙක්. ඒ නිසාම දරුවන් හොඳ මගට යවන්න පුළුවන්කමක් ලැබුණු පියෙක්. ඒ නිසා මනුෂ්‍යයෙක් හැටියට ජීවිතය ලැබුවාට පස්සේ සමාජය තුළ තමන්ට කළ හැකි ඒ මනුෂ්‍ය ගුණාංග, මනුෂ්‍ය යුතුකම් නිවැරදිව ක්‍රියාත්මක කළ පුද්ගලයෙක්. ඒ වාගේම, දේශපාලඥයෙක් හැටියට ඔහුගේ පරාසය තුළ ඔහු ඔහුගේ කටයුත්ත නිවැරදිව ක්‍රියාත්මක කළා කියන කාරණය අපි එතුමාට ගෞරවයක් වශයෙන් මෙහි සටහන් කරන්න ඕනෑ ගරු සභාපතිතුමනි. ඒ පළාත් පාලන ක්ෂේත්‍රය තුළ යම් දෙයක් සමාජයට කළ හැකියි කියන විශ්වාසය චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා තුළ තිබුණා. ඒ නිසාම තමයි ඔහු පළාත් සභාවේ ඉඳලා නැවතත් අස් වෙලා ගිහිල්ලා පළාත් පාලන ආයතනයේ තමන් ආදරය කරපු කොළොන්නාව නගර සභාවටම ගිහිල්ලා ඔහු ඒ කටයුත්ත කළේ. අවසාන දවසෙත් එතුමා - මම හිතන්නේ වාසනාවන්ත මරණයක් කියලා. තමුන් ආදරය කරපු නගර සභා රැස්වීම් ශාලාවේ තමන්ගේ ආසනයේම තමන්ගේ අවසන් හුස්ම හෙළපු මහජන නියෝජිතයෙක් ඉන්නවා නම් මම හිතන්නේ ඒ චන්ද්‍රසිරි ඩයස් මහතා විතරයි කියලයි මම අහලා තියෙන්නේ. වෙන කවුරුවත් ගැන මගේ ජීවිතයේ මම අහලා නැහැ. තමන් නියෝජනය කරන, තමන්ගේ සභාවේ ආසනයේ ඉඳගෙන අවසන් හුස්ම හෙළපු පුද්ගලයෙක්. ඔහු ඒ තරමටම නගර සභාවත් එක්ක සමීප සම්බන්ධතාවක් පැවැත්වූවා. ඒ සම්බන්ධතාවය ඔහු අවසන් හුස්ම දක්වා පැවතුණා. ඒ නගර සභාවේ ජීවිතය ඔහුට මහා සොඳුරු තැනක් වුණා. ඒ නිසා ඔබතුමා මගින් චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාගේ ආදරණීය දියණිය, ආදරණීය පුතණුවන් ඇතුළු ඒ පවුලේ සැමට මාගේ පෞද්ගලික ශෝකයත්, මා නියෝජනය කරන එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළොන්නාවේ සියලුම දේශපාලන අධිකාරියේ අපේ සහෝදර නායකත්වයේ සියලුම දෙනාගේ ශෝකයත් මේ අවස්ථාවේ ඔබතුමා මගින් ඒ පවුලේ උදවියට පුද කරමින්, අවසාන වශයෙන් චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාට නිර්වාණ සම්පත්තිය සාක්ෂාත් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මාගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මේ ශෝකාකුල පණිවුඩය ගෙනෙන මේ මොහොතේ අපේ පළාත් සභා මන්ත්‍රීවරුන් චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා සම්බන්ධයෙන් විවිධ ගුණකථනයන් කරනු ලබනවා. එතුමා තුළ තිබුණු පුදුමාකාර මනුස්සකම, නිහතමානීත්වය අද දේශපාලනයේ ඉන්න අප සියලු දෙනාටම හොඳ ආදර්ශයක්. මට මේ පළාත් සභාවට ආපු පළමුවැනි දවසට ඉස්සෙල්ලා ඉසිපතන විද්‍යාලයේ ඡන්ද ගණන් කරද්දී මගෙන් එතුමා ඇහුවේ, ඇයි? ප්‍රාදේශීය සභාවෙන් ඉවත් වෙලා පළාත් සභාවට එන්න තීරණය කළේ කියලා. එතුමා හැමතිස්සේම කිව්වේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් කියන්නේ ජනතාවගෙන් ඈත් වෙන චරිතයක් බවට මේ පවතින ක්‍රමය තුළ පත් කරලා තියෙනවයි කියලා. එතුමා කිව්වේ පළාත් සභා මන්ත්‍රීවරයාට වඩා නගර සභා මන්ත්‍රීවරයා ජීවත් වෙන්නේ, ජනතාවගේ හදවතේ කියලා. අද අපි මේ බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපනයට, එහෙම නැත්නම් සෞඛ්‍යයට, එහෙම නැත්නම් කෘෂිකර්මයට මේ ඕනෑම විෂයයකට විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කළත්, විශේෂයෙන්ම පළාත් පාලන විෂය තමයි ජනතාවගේ පපුවේ තියෙන විෂය බවට පත් වෙලා තියෙන්නේ. උපතේ සිට විපත දක්වා වූ ඒ සියලුම කාර්යයන්වලදී ජනතාවට වඩාත්ම සමීපතම ස්ථානය ප්‍රාදේශීය සභාව. එහෙම නැත්නම් නගර සභාව. ඒ නගර සභාව තුළ චිත්‍රා ඩයස් කියන චරිතය තමන්ටම අවේණික අනන්‍යතාවයක්. කොළොන්නාව ආසනයේ පමණක් නොවෙයි. මම හිතන්නේ අනෙකුත් නගර සභාවල සභාපතිවරු, උප සභාපතිවරු, ප්‍රාදේශීය සභාපතිවරුන්ගේ හදවත් තුළ තියෙනවා. අර රේණුක පෙරේරා මැතිතුමා කිව්වා වාගේ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඔහු පළාත් සභාවෙන් ඉවත් වෙලා ගියේ නගර සභාව ආදායම් මාර්ගය කර ගන්න නොවෙයි. මේ පළාත් සභාවේ සිටි මන්ත්‍රීවරු මේ පළාත් සභාවෙන් අයින් වෙලා නගර සභාවලට ඉල්ලුවා. ප්‍රාදේශීය සභාවලට ඉල්ලලා දිනලා ගිහිල්ලා අද ඒ තනතුරු ආදායම් මාර්ග බවට පත් කර ගෙන තියෙන කොට චිත්‍රා ඩයස් මැතිතුමා සුපුරුදු විධියට නගර සභාවට නැවතත් ගිහිල්ලා ජනතාවගේ හදවතේ ජීවත් වෙමින් නගර සභාවේ නගරාධිපතිවරයා විධියට කොළොන්නාවට සුවිශාල කර්ය භාරයක් කළා. රේණුක දුෂ්‍යන්ත පෙරේරා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා එතුමා නගර සභාව ඇතුලේ මිය ගියා කියලා. හැබැයි, ඔහු මියගියේ ඔහුට අදාළ පුටුවේ නොවෙයි. එදා ඡන්දය නිසියාකාරයෙන් තිබ්බා නම් - අපි කවුරුත් මිය යනවා. ඔහු මිය යන්න ඕනෑ නගරාධිපති පුටුවේ. නමුත් එතුමාට කොළොන්නාවේ එදා දවසේ තිබුණු මැතිවරණ ප්‍රචණ්ඩත්වය එතුමාගෙන් නගරාධිපති ධූරය උදුරා ගත්තා. නමුත් මේ අට ලෝ දහමෙන් කම්පා නොවුණු තමන්ගේ අතේ තියෙන පෞද්ගලික මුදලින් ජීවිතේ ගැටගහ ගත්ත අපේ කාලයේ අහිංසක, නිර්ව්‍යාජ දේශපාලන නායකයෙක් විධියට තමයි අපි චිත්‍රා ඩයස් මහත්මයාව හඳුන්වන්නේ. එතුමාට ජීවිතේ මහා ලොකු බලාපොරොත්තු තිබුණේ නැහැ. එතුමාට මොන්ටේරෝ ප්‍රාඩෝ සංස්කෘතියක් පිළිබඳ අදහසක් තිබුණේ නැහැ. මහල් නිවාස පිළිබඳ අදහසක් එතුමාගේ සිතේ තිබුණේ නැහැ. ගොඩනැගිල්ලක් අනුමත කරන්න එන කොට එතුමා කවදාවත් කිසිම පුද්ගලයෙකුගෙන් - අද නගරාධිපතිවරු ගාවට යනකොට ගරු සභාපතිතුමනි, අපට සතුටු වෙන්න පුළුවන්. මම දන්නා එක්තරා නගර සභාවකට ටයි එකක් ඇඳගත්ත කවුරුහරි ආවොත් ඒ සභාපතිවරයා වෙනමම ගෝලයෙක් දාලා ඉන්නවා ඔහුව ගිහිල්ලා අල්ලා ගෙන එන්න. ඒ හිතන්නේ ඉඩම් කට්ටි අනුමත කර ගන්න ආපු සමාගමක මහත්මයෙක් කියලා. එහෙම නගර සභා අද අපේ රටේ තියෙනවා. හැබැයි, චිත්‍රා ඩයස් මහත්මයා කවදාවත් මහජන මුදල් රුපියලක්වත් සොරකම් කළේ නැහැ. අපි අහලා තියෙනවා. සිරිපාදේ යන කොට සෙල් ලිපියක් තියෙනවා. ඒකේ තියෙනවා, මහජන මුදල් සොරම් කළොත් ලබන ආත්මයේ බල්ලෙක් හෝ කපුටෙක් වෙලා ඉපදෙනවා කියලා.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

අනුරාධපුරේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

සිරීපාදේත් තියෙනවා. ඔබතුමා අනුරාධපුරේ දැකලා ඇති. මම සිරීපාදේදි දැකලා තියෙන්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා කවදාවත් චිත්‍රා ඩයස් මහත්මයා මහජන මුදල් රුපියලක්වත් සොරකම් නොකරපු, ඉතාමත්ම පැහැදිලිව සභාපති තනතුරේ තමන්ගේ සීමාවන් ඇතුලේ බලය පාවච්චි කරපු නායකයෙක් කියලා අපි දන්නවා. සභාපතිවරයෙක් ඉවත් කරන්න මහ ඇමතිවරයෙකුට බලය තිබෙනවා. මේ පළාත් සභාවේ මහ ඇමතිතුමාට සමහර සභාපතිවරු ගැන, නගරාධිපතිවරු ගැන විවිධ චෝදනා එනවා. මේ සභාව ඇතුලේ. අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් පවා සමහර නගරාධිපතිවරු පිළිබඳ චෝදනා එනවා. පක්ෂ විපක්ෂ දෙපාර්ශවයෙන්ම. කවදාවත් චිත්‍රා ඩයස් ගේ පාලනය පිළිබඳව, කොළොන්නාව නගර සභාව මෙහෙයවූ ආකාරය පිළිබඳව කිසිදු ආකාරයක පැමිණිල්ලක් රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමාටවත්, එහෙම නැත්නම් ඊට පෙර මහ ඇමති ධූරය දැරූ සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාටවත් කවදාවත් ලැබුණේ නැහැ. ඒ කියන්නේ, ඔහු පක්ෂ විපක්ෂ සියලු දෙනාත්

[ ගරු නිරෝෂන් පාදුක්ක ]

එක්ක එකතු වෙලා ඒ නගර සභාව මනා ලෙස පාලනය කළා විතරක් නෙවෙයි ඉතා පිරිසිදු නගර සභාවක් බවට පත් කළා. ඒ නිසා දේශපාලනය කරන අපි සියලු දෙනාටම චිත්‍රා ඩයස් මහත්මයා හොඳ පූර්වාදර්ශයක් දුන්නා විතරක් නොවෙයි, අපටත් වඩා මේ ලංකාවේ නගර සභාවල නායකයින්ට පුහුණු සැසියක් පවත්වන අවස්ථාවලදී චිත්‍රා ඩයස් චරිතාපදානය කෙසේද කියලා. ඔහු කොහොමද නගර සභාවක් දියුණු තැනකට අරගෙන ගියේ? රේණුක පෙරේරා ආණ්ඩු පක්‍ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා වාගේ එක්සත් ජාතික පාක්ෂිකයන්ට පමණක් නොවෙයි, නගර සභා ඡන්දයක් එන කොට ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ගේ පවා ඡන්දය නගර සභාවට ගැනීමට හැකියාවක් එතුමාගේ චරිතය තුළ තිබුණේ කොහොමද කියන දේ අපි සියලු දෙනාම මේ අවස්ථාවේ කල්පනා කරන්න ඕනෑ.

ඒ නිසා අපි විශ්වාස කරන විධියට තමන් ගරු කරන දේශපාලන දර්ශනය, මතවාදය වෙනුවෙන් අසාමාන්‍ය කැපවීම් කළ නායකයෙක්. ඔහුටත් තිබුණා ඉල්ලීම්. තමන්ගේ පක්ෂය අත හැරලා වෙනත් පක්ෂවලට එන්න කියලා ඔහුට ඉල්ලීම් කළා. හැබැයි ගරු සභාපතිතුමනි, ඔහු කවදාවත් - සමහර අපේ දේශපාලනඥයන් පහුගිය කාලේ වයසට යන කොට අපේ පක්ෂය මදි වුණා. වයසට යන කොට තමන්ගේ වයසත් එක්ක කල්පනා කරලා සමහර තීන්දු ගත්තා. හැබැයි, චිත්‍රා ඩයස් මහත්මයා කවදාවත් හීනෙන්වත් අලියාගෙන් පිට වෙනම සලකුණක් මත යොමු වුණේ නැහැ. ඔහු එක්සත් ජාතික පක්ෂයත් එක්ක, තමන් ගරු කරන දේශපාලන පක්ෂයත් එක්ක, දේශපාලන දර්ශනයත් එක්ක ජීවත් වෙලා එතුමා මේ විධියට මිය ගියත් ඔහු ඉතිරි කර ගිය මතකය මේ පළාත් පාලන ක්‍රමය තුළ සදාකාලිකව තිබෙන බව විශ්වාස කරමින්, ඒ අප ආදරය කළ නිර්ව්‍යාජ දේශපාලනඥ චිත්‍රා ඩයස් මැතිතුමාට අමා මහ නිවන් සැප අත් වේවායි ප්‍රාර්ථනා කරමින්, මේ මොහොතේ එතුමාගේ ආදරණීය දරුවන් දොපොළටත් පෞද්ගලිකව මගේ ශෝකයත් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු හෙක්ටර් බෙත්මගෙ¯**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මා නොඅදහන දේශපාලන දර්ශනයක් අදහන කෙනෙකුගේ වුණත් ඒ වාගේම වටිනා පුද්ගලයෙක්, වටිනා දේශපානඥයෙක්, ගුණගරුක මනුෂ්‍යයෙක් පිළිබඳව මේ සභාවේ වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව මම ප්‍රථමයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අද මේ ශෝක ප්‍රකාශය පිළිබඳව කථා කරන බස්නාහිර පළාත් සභාවේ හිටපු පළාත් සභා මන්ත්‍රී, ඒ වාගේම කොළොන්නාව නගර සභාවේ නගරාධිපති ධූරය දරපු චිත්‍රා ඩයස් මැතිතුමා පිළිබඳව කථා කරන්නේ අවංක සැබෑ හදවතින් කියන කාරණාව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. මම එහෙම මගේ කථාව නිර්වචනය කළේ, අපි හුහාක් වෙලාවට මූනිච්ඡාවට ගුණ කථන කරනවා. අපි හුහාක් වෙලාවට නොයෙක් අවස්ථාවලදී එහෙම කරලා තියෙනවා. නමුත් චිත්‍රා ඩයස් මැතිතුමා පිළිබඳව, එතුමාගේ දේශපාලනය පිළිබඳව, එතුමාගේ මන්ත්‍රී ධූරය පිළිබඳව, එතුමාගේ නගරාධිපති ධූරය පිළිබඳව කථා කරන කොට අර මම මුලින් කිව්වා වාගේ එතුමාගේ දේශපාලන ධර්මය අදහන්නේ නැති කෙනෙක් හැටියට වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අපි එතුමා පිළිබඳව ආදරයෙන් කථා කරන අවස්ථාවක් තමයි මේ අවස්ථාව. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කිව්වා, එතුමාගේ පාලන කාලය තුළ එතුමා පක්ෂ විපක්ෂ කාගේත් ආදරයට, ගෞරවයට පාත්‍ර වෙන්න කටයුතු කළයි කියලා. ඊට එහා ගිය කාරණාවක් මම කියන්න ඕනෑ. ඕනෑම පළාත් පාලන ආයතනයක ප්‍රධානියාට ඒ පක්ෂයේම ආණ්ඩු බලය තියෙන පක්ෂයක් නම් හරි ලේසියි පාලනය කරන්න. සාමාන්‍යයෙන් දැන් අපේ ආණ්ඩුව තියෙන්නේ. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය. අපේ පාලන කාලයේ අපේ පළාත් පාලන ආයතනවලට සාමාන්‍යයෙන් ආරක්ෂාවක් රැකවරණයක් තියෙනවා. ඒ කථාව ඇත්ත. නමුත් ආණ්ඩු බලයක් නැතුව පළාත් පාලන ආයතනයක ඉහළම පාලකයා වෙලා කටයුතු කිරීම හරිම අසීරුයි. මම අන්න ඒකයි දකින්නේ. එක්සත් ජාතික පක්ෂයේ බලය නැති වකවානුවක, එක්සත් ජාතික පක්ෂයේ නගරාධිපතිවරයා හැටියට, ආණ්ඩු පක්ෂයෙන් කෙරෙන යම් යම් බලපෑම් ඇතැම් විට තිබුණත් නැති වුණත් ඒවා සීරු මාරු කර ගෙන ඒ පරිපාලනය කිරීම තමයි ඉතාමත්ම වැදගත් වන්නේ. ඒ අවස්ථාව චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාට තිබුණා. මම ඒකේ වටිනාකම දන්නවා. කඩුවෙල

ප්‍රාදේශීය සභාවේ ප්‍රථම සභාපතිවරයා හැටියට කටයුතු කරන කොට අපි එදා එක්සත් ජාතික පක්ෂ රජයක් මේ රටේ තිබුණේ. ඒ බලපෑමට අපි නතු වෙලා, ඒ බලපෑමට යටත් වෙලා ඉතාමත්ම සීරුවෙන් අපි එදා පාලනය කළේ. ඒ අත්දැකීම මට තියෙනවා. මෙතැන ඉන්න ජගත් අංගගේ ගරු ඇමතිතුමාට තියෙනවා. අපේ මංජු ශ්‍රී අරංගල මැතිතුමාටත් ඒ අත්දැකීම තියෙනවා. මෙන්න මේකයි වටිනාම අවස්ථාව මම දකින්නේ. ඒ නිසා චිත්‍රා ඩයස් මැතිතුමා -

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

සිරිකමල් ගරු මන්ත්‍රීතුමාටත් තියෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම හිතන්නේ සිරිකමල් ගරු මන්ත්‍රීතුමාට ඒ අවස්ථාව නැහැ.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

තිබුණා. තිබුණා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අපි එකට හිටියේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

තියෙන්න ඇති. ඒ වුණාට අපි දෙන්නම එකට හිටියේ ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ නේ? එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ ඔබතුමා සභාපති වුණේ. අපි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ වෙනත් පක්ෂයක් නියෝජනය කරපු එකයි වෙනස. චිත්‍රා ඩයස් මැතිතුමාත් එහෙමයි. මංජු ශ්‍රී අරංගල මැතිතුමාත් එහෙමයි. මේකයි තියෙන තත්ත්වය. ඒ කාර්ය භාරය හරියට ඉෂ්ට කරපු දේශපාලන යුග පුරුෂයෙක් කියන කාරණාව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම චිත්‍රා ඩයස් මැතිතුමාගේ පුදුම ගුණගරුක ස්වභාවයක් තිබුණා. දැන් තමුන්නාන්සේලාත් දන්නවා. ප්‍රසිද්ධියේ කියන්න ඕනෑ. අපේ දේශපාලන තරගාවලියේදී අපට තියෙනවා විශාල මානසික තරගයක්. රැස්වීමකට ගියාම, ධූරාවලිය අනුව පුටුව දෙන්න පුළුවන්. නැති වෙන්න පුළුවන්. ගරු කරන්න පුළුවන්. නොකරන්න පුළුවන්. නමුත් මට මතකයි මම ඇමතිවරයෙක් හැටියට කටයුතු කරන අවස්ථාවේදී, මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කරන අවස්ථාවේදී කොලොන්නාව ප්‍රදේශයෙ යම්කිසි උත්සව අවස්ථාවකට, නැත්නම් විශේෂ අවස්ථාවකට ගියාම මට විතරක් නොවෙයි. චිත්‍රා ඩයස් මැතිතුමා නගරාධිපතිවරයා හැටියට කථා කරලා, ඉතාමත් ඉහළින් ප්‍රතිචාර දක්වලා ආදර සමාචාර කරලා පක්ෂය බලන්නේ නැතුව අපට නිසි ගෞරවය ලබා දුන්නා. ඒ අවස්ථාවේදී මම ඒ නිසි ගෞරවය ලබමින්ම මම එදා කල්පනා කරලා තියෙනවා, මේ වාගේ උතුම් මිනිස්සු, පක්ෂය මොකක් වුණත්, මේ අය තමයි දේශපාලනයේ සිටිය යුත්තේ කියන කාරණාව. නමුත් එතුමා අපට අහිමි වුණා. ඒ පිළිබඳව දැඩි ශෝකයක් දැනෙනවා. මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

ඊළඟ කාරණාය තමයි මම දකින්නේ, අද බලය සඳහා ඒකරාශී වන කොට මිනිස්සු සියලුම දේවල් අත හැරලා තමන්ගේ පක්ෂය පාවලා දෙනවා. ඒක අපේ පැත්තෙත් එහෙමයි. ඔය පැත්තෙත් එහෙමයි. මම මේක විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. එතුමාට ඒ පක්ෂය තුළ නිසි තැන ලැබුණත්, නොලැබුණත් එතුමා එතුමාගේ ප්‍රතිපත්ති රාමුව තුළ, එතුමාගේ දේශපාලන ධර්මය තුළ රැඳී සිටිමින් ඔහුගේ පක්ෂ ප්‍රතිපත්තිය ගෙන යන්න උත්සුක වුණා. ඒ නිසා ඔහුට ලැබිය යුතු තැන්වලට යා ගන්න බැරි වුණා. සමහරවිට එතුමා ඒ පිළිබඳව සිත් තැවුලෙන් ඉන්න ඇති. අර රේණුක පෙරේරා මැතිතුමා කිව්වා වාගේ යම්කිසි අවස්ථාවක පක්ෂයේ ඉහළ බලපෑම් පිළිබඳව පෞද්ගලිකව කථිකා කරන්න ඇති. ඒ සියලු දේවල් තුළ අපි දකින්නේ නිර්ව්‍යාජ දේශපාලන මනුෂ්‍යත්වය තිබෙන උතුම් මනුස්සයෙක් කියන කාරණාවයි අපට මේ සභාවේදී කියන්න වුවමනා වෙලා තියෙන්නේ. ඒ අනුව එතුමා පිළිබඳ මෙතැනින් එහාට මම කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. හැම කෙනෙකුගේම මුවින් ඒක ප්‍රකාශ වුණා.

අවසාන වශයෙන් එතුමාගේ ආදරණීය දරුවන් දෙපළට, දියණියට, පුතාට පියා වෙනුවෙන් ගෞරවය පුද කරනවා. ඒ වාගේම ඒ දෙපළගෙන් අපි ඉල්ලා සිටිනවා. පියා ගිය අඩි පාරේ යන්න. පක්ෂය මොකක් වුණත් දේශපාලනය තුළ මේ රටේ ජනතාවට සේවය කරන්න ඔබලාටත් ඒ ශක්තිය සහ ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින්, අවසාන වශයෙන් අපේ මේ කල්‍යාණ දේශපාලන මිත්‍රයා, චිත්‍රා ඩයස් මැතිතුමාට අපි බෞද්ධයින් හැටියට පතන ඒ ශාන්ත අමා මහ නිර්වාණ සම්පත්තිය ලැබීමට හේතු වාසනා වේවායි ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව එතුමාට උපහාරයක් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, චිත්‍රා ඩයස් අපේ හිටපු පළාත් සභා මන්ත්‍රීතුමාගේ නගරාධිපතිතුමාගේ ශෝක යෝජනාවට යමක් එක් කිරීමට හැකි වීම මම භාග්‍යයක් කොට සලකනවා. මෙතුමා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරපු පළාත් පාලන ආයතනයක ප්‍රධානියා වුණත්, කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරපු බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙක් වුණත් එතුමාගේ ජීවිතයේ විශාල කාලයක් දොම්පේ ආසනයේ මණ්ඩාවල ප්‍රදේශයේ අපේ ගමේ ජීවත් වුණු පුද්ගලයෙකු හැටියට විශේෂයෙන්ම එතුමාගේ විවාහය මණ්ඩාවල ප්‍රදේශයේ අපේ

ඥාතීන්ගේ පවුලකට සම්බන්ධ වීම පිළිබඳව අපේ වාසනාවක් හැටියට පිළිගන්නවා. එතුමාගේ වැඩිපුර කාලය, සේවය කොලොන්නාවටත්, කොළඹ දිස්ත්‍රික්කයටත් සිදු වුණත් එතුමාගේ යම් කිසි දායකත්වයක් දොම්පේ ආසනයට ලබා දීම පිළිබඳව මේ අවස්ථාවේදී ඉතා සතුටින් මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම එතුමා මණ්ඩාවල ප්‍රදේශයේ ජීවත් වීම අපට විශාල ශක්තියක් බවට පත් වුණා. එතුමා කොලොන්නාවේ නගරාධිපති වෙලා මණ්ඩාවල ප්‍රදේශයේ එතුමා ජීවත් වීම අපේ ප්‍රදේශයට දැවැන්ත ශක්තියක් හැටියට අපි සලකනවා. විශේෂයෙන්ම මගේ ආදරණීය පියාණන් සමඟ එකට ඒ ප්‍රදේශයේ ආගමික කටයුතුවලට, දේශපාලන කටයුතුවලට වසර ගණනාවක් තිස්සේ සම්බන්ධ වෙමින් ඒ ප්‍රදේශයේ ජීවත් වූ පුද්ගලයෙකු හැටියට විශාල සේවාවක් ප්‍රදේශයට එතුමාගෙන් සිදු වුණා.

මම පෞද්ගලිකව එතුමාව දශක ගණනාවක් ඇසුරු කළ පුද්ගලයෙකු නොවුණත්, මගේ දේශපාලන කටයුතුවලදීත් එතුමාත්, එතුමාගේ ආදරණීය පුත්‍ර රත්නය මංජුත් නොයෙකුත් අවස්ථාවලදී සම්බන්ධ වෙලා තියෙනවා. මට පෞද්ගලිකව සතුටු වෙන්න පුළුවන්. පසුගිය පළාත් පාලන මැතිවරණයේදී එතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් කොළොන්නාව ප්‍රදේශයේ දේශපාලන කටයුතුවලට මට ආරාධනා කරලා මම ඒ කටයුත්තට සම්බන්ධ වුණු වෙලාවේ තමයි මට චිත්‍රා ඩයස් නැමති මේ දැවැන්තයා ගැන ඇත්තටම වැටහීමක් ලැබුණේ. ඒ ප්‍රදේශයේ එතුමාට තියෙන සැලකිල්ල. ඒ ප්‍රදේශයේ ජනතාව, ඒ ප්‍රදේශයේ නායකයෙකු හැටියට වඩා ආදරය කරන හිතවතෙක් හැටියට, සෑම නිවසකම

[ ගරු හර්ෂණ රාජකරුණා ]

දුප්පත්ම ජනතාව එතුමාගේ මිත්‍රයෙක් බවට පත් වුණා. එතුමාගේ අවසාන කටයුතුවලට යන වේලාවේදීත් ඒ මුළු කොළොන්නාව ප්‍රදේශයේම ජනතාව දුක් වුණා. ඒ කොළොන්නාව ප්‍රදේශයට විශාල පාඩුවක්. මෙවැනි නගරාධිපතිවරයෙක් අපට ජීවිතේටවත් ලැබෙන්නේ නැහැයි කියන කථාව සෑම පුද්ගලයෙකුගෙන්ම හඬ නැගුණා. ඒ කොළොන්නාවට වුණු පාඩුව මම හිතන්නේ, මමත් විශ්වාස කරනවා. එතුමාට අවසාන මොහොතේදී අවසාන සභාවේ අයවැය විවාදය පැවැත්වෙන වේලාවේදී එතුමා අභාවප්‍රාප්ත වුණේ. ඉතින් එවැනි දැවැන්ත දේශපාලනඥයෙක්. මෙතැන කථා කරපු සියලු දෙනාම කිව්වා, දූෂණ කරපු පුද්ගලයෙක් කියලා එතුමාට චෝදනා කරන්න බැහැයි කියලා. මම ඒක හොඳින්ම දන්නවා, මණ්ඩාවල එතුමා ජීවත් වුණු නිවස දිහා බැලුවාම. දැන් ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙක්, නගර සභාවක නගරාධිපතිවරු බොහෝ පිරිසක් තමන් ජීවත් වුණු ආකාරයත් දැන් ජීවත් වන ආකාරයත් දිහා බලන කොට ඒ පුද්ගලයින්ගේ චරිතය ගැන හොඳින් වටහා ගන්න පුළුවන් වෙනවා. එතුමා ඉතා සාමාන්‍ය පුද්ගලයෙක් හැටියට සාමාන්‍ය නිවසක, සාමාන්‍ය විධියට ජීවත් වුණු පුද්ගලයෙක්. ඒ වාගේම එතුමාගේ බිරිඳ අභාවප්‍රාප්ත වූවායින් පසුව දූ දරුවන්ගේ සියලුම අවශ්‍යතාවයන් ඉටු කර දෙන මවගේත්, පියාගේත් දෙදෙනාගේම කටයුතු එතුමා විසින් තනියෙන්ම ඉටු කරලා ඒ දූ දරුවන් දෙදෙනාව යහපත් පුද්ගලයන් ලෙස ජීවත් වෙන්න පුළුවන් ආකාරයට පත් කරන්න කටයුතු කළා. එවැනි චරිතයක් මම හිතන්නේ ඉතා කලාතුරකින් තමයි අපට දැකගන්න, අහන්න පුළුවන් වන්නේ. පෞද්ගලිකව මම හිතනවා. මට එතුමාව මීට වඩා වැඩි කාලයක් ආශ්‍රය කරන්න පුළුවන්කම, වාසනාව තිබුණා නම්, එතුමාගෙන් ඉගෙන ගන්න බොහෝ දේ තිබුණා. මේ දේශපාලන ක්ෂේත්‍රය ගැන පමණක් නොවෙයි. පුද්ගලයෙකු හැටියට ඉගෙන ගන්න මම හිතන්නේ බොහෝ කාරණා මටත් දැනගන්න පුළුවන්කමක් තිබුණා. නමුත් අපේ අවාසනාවට, කොළොන්නාව ප්‍රදේශයේ අවාසනාවට, එතුමා ජීවත් වූ දොම්පේ ප්‍රදේශයේ අවාසනාවට තවත් වසර ගණනාවක් සමාජ සේවකයෙකු හැටියට ජීවත් වෙන්න කාලය තිබුණත්, වයස තිබුණත් අවාසනාවන්ත ලෙස අප අතරින් වෙන් වුණා. මේ අවස්ථාවේදී දොම්පේ ආසනයේ එක්සත් ජාතික පක්ෂ සංවිධායක හැටියටත්, ඒ වාගේම මගේ ඥාති මිත්‍රයෙක් හැටියටත් එතුමාගේ පවුලේ සියලු දෙනාටම මාගේ ශෝකය ප්‍රකාශ කරමින් අපේ චිත්‍රා ඩයස් හිටපු නගරාධිපතිතුමාට, හිටපු පළාත් සභා මන්ත්‍රීතුමාට නිවන් සැප ලැබේවා යි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, ප්‍රතිපක්ෂ දේශපාලඥයෙක් වෙනුවෙන් මේ අවස්ථාවේදී ගුණකථනයක් පැවැත්වීමට අවස්ථාව ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මට මතකයි, එක්තරා ස්වාමීන් වහන්සේ නමකට සංඝනායක පදවියක් ලැබුණු අවස්ථාවේදී එම නිකායේ මහානායක හාමුදුරුවන් ඒ ස්වාමීන් වහන්සේට කරපු අවවාදයක්.

*බෞද්ධ භික්ෂූන් හැටියට අපි අපේ උපාසක මහත්වරුන්ගේ අවමංගල්‍ය උත්සවවලට යනවා. ගිහිල්ලා ඒ පුද්ගලයා මොන තරම් දූෂිතයෙක් වුණත්, මොන තරම් සමාජ විරෝධී ක්‍රියාවන් කළත් අපි ඔහු ගැන කියන්නේ මොහු උභයකුල පාරිශුද්ධ, මහා බෞද්ධ උපාසකයෙක් කියායි. ඒ නිසා මේ අද සංඝනායක පදවිය ලබන හාමුදුරුවන්ගෙන් මා ඉල්ලා සිටිනවා, බෞද්ධ භික්ෂුවක් හැටියට මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාධියාමි කියන ශික්ෂා පදය කඩන්නට එපාය කියලා.*

දේශපාලඥයෙක් හැටියට මේ කථාව මගේ හිතට විතරක් නොවෙයි. හදවතටත් වැදුණු දෙයක්. හැබැයි සභාපතිතුමනි, දේශපාලඥයෝ හැටියට අපට කෙනෙක් මිය ගියාට පසුව ඔහුගේ නුගුණ කියන්න බැහැ. ඒ නිසා එදා ඉඳල මම තීරණය කළා, මට ගිහිල්ලා ඒ මනුස්සයා හොඳයි කියන්න බැරි මළ ගෙදරක කථාවක් පවත්වන්නේ නැත කියලා. ඒ මළ ගෙදරට කලින් ගිහිල්ලා අවසාන ගෞරවය දක්වලා එනවා. නමුත් කථාවක් පවත්වන්න වෙන, අවස්ථාවක එතැනට යන්නේ නැහැයි කියලා. අද අපි මේ ප්‍රතිපක්ෂ මන්ත්‍රීවරයෙක් වෙනුවෙන් අපේ කාලය වැය

කර ගෙන මෙතැන රැඳී සිටිමින් මේ කථාව කරන්නේ, හදවතට එකහව දේශපාලඥයෙක් හැටියට මහත්මා දේශපාලනය කරපු විශිෂ්ට මනුස්සයෙක් වෙනුවෙන්.

එක්සත් ජාතික පක්ෂය ගැන මම වචනයක් කියන්න ඕනෑ. කවුරු හරි කෙනෙක් මගෙන් ඇහුවොත්, ඔබ විශ්වාස කරන දේශපාලන දර්ශනය ශ්‍රි ලංකා නිදහස් පක්ෂය හැරුනු විට ඔබ ආදරය කරන දේශපාලන පක්ෂය මොකක්ද කියලා මම කිසිම පැකිලීමකින් තොරව කියනවා ඒක එක්සත් ජාතික පක්ෂය කියලා. මා එහෙම කියන්නේ, කරුණු කාරණා රාශියක් ඇතුව. එක්සත් ජාතික පක්ෂයේ වංශ දෙකක් තිබුණා. 1977 න් පස්සේ එක්සත් ජාතික පක්ෂය. ඊට පෙර එක්සත් ජාතික පක්ෂය. මේ චන්ද්‍රසිරි ඩයස් අයිති වන්නේ මම මෙන්න මේ කියන වංශයට. ඩඩ්ලි, ඩී.එස්, යූ.බී. වන්නිනායක, එම්.ඩී. බණ්ඩා, ගාමිණී ජයසූරිය ඇතුළත් වන වංශයට තමයි චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා අයිති වන්නේ. මම එහෙම කියන්නේ, ඒ එක්සත් ජාතික පක්ෂයේ විශිෂ්ට නායකවරු තමන්ගේ දේශපාලනය බඩගෝස්තරය වෙනුවෙන් පාවිච්චි නොකරපු, අවසානයේ තමුන් ජීවිත ගමනින් සමුගන්නා විට බොහොම අහිංසක අසරණ විධියට ජීවිතය සමුගත්ත විශිෂ්ට නායකයන් නිසයි. මේ ගුණාංග තියෙන අය අපේ පක්ෂයේත් ඉන්නවා. ඒ වාගේම මේ ගුණාංග නැති පිරිසක් මේ පක්ෂ දෙකේම ඉන්නවා. ඉදිරි අනාගතයේදී මේ රටේ ජනතාවට තීන්දු කරන්න වෙන්නේ මහජන නියෝජිතයා එක්සත් ජාතික පක්ෂයේද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේද කියා නොව, ඔහු හොඳද නරකද කියන කාරණාවයි. එක්සත් ජාතික පක්ෂයෙන් වේවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයෙන් වේවා ඉදිරිපත් වන අපේක්ෂකයා හොඳ මිනිහෙක්ද, නරක මිනිහෙක්ද කියන කාරණාව තමයි ඉදිරි කාලයේදී මේ රටේ ජනතාව තීන්දු කළ යුතු වන්නේ. අද මේ රටේ ප්‍රාදේශීය දේශපාලනය ඉතා නින්දිත ලෙස පරිහාණියට ලක් වුණු යුගයක්.

ගරු සභාපතිතුමනි, ඊයේ පුවත්පත් අරගෙන බලන්න. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු අත්අඩංගුවට පත්වනවා, ගංජා මිටි විස්සක් අතේ තියා ගෙන. මේ තරම් පහළ තත්ත්වයකට මේ රට පත් වුණේ, මුදල් ඉපැයීම සඳහා මුදල් මතම ක්‍රියාත්මක වූ කාලකණ්ණි දේශපාලනයක් මේ රට තුළ ඉස්මතු වූ නිසයි. අන්න එවැනි යුගයක, ප්‍රාදේශීය දේශපාලනය නින්දිත පාපතර තත්ත්වයට වැටුණු යුගයක චන්ද්‍රසිරි ඩයස්ලා මතු වන්නේ, දේශපාලන ගොහොරුවේ පිපිණු ධවල පුෂ්පයන් විධියටයි. මට මතකයි තරුණ මන්ත්‍රීවරයෙක් විධියට අපි මේ සභාවට ආපු කාලයේ ඒ වාගේ දැන උගත්කම් තියෙන, අත්දැකීම් තියෙන මන්ත්‍රීවරු අපට ඇසුරු කරන්න ලැබුණා. ඇත්තෙන්ම චන්ද්‍රසිරි ඩයස් කියන දේශපාලඥයාට ප්‍රාදේශිය සභාවේ, නගර සභාවේ සභාපතිවරයා හැටියට සල්ලි හම්බ කරන්න ඕනෑ තරම් මාර්ග තිබුණා. අද මේ රටේ ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ වත්කම් පිළිබඳ ප්‍රකාශයන් ගත්තොත් ඔවුන් දේශපාලනයට එන දවසේ තිබුණු වත්කමත්, අද වන කොට ඔවුන් හම්බ කර ගෙන තිබෙන ධනයත් පිළිබඳව අපට හොයා බලන්න පුළුවන්. නමුත් මේ චන්ද්‍රසිරි ඩයස් කියන නිහතමානී මනුස්සයා කවදාවත් අල්ලසට දූෂණයට යොමු වුණු පුද්ගලයෙක් නොවෙයි. එදා දේශපාලනයේදී අපට කථා කරන්න වුණේ වැරදි වැඩ කරන දේශපාලඥයන් දෙතුන් දෙනෙක් ගැන විතරයි. අනෙක් සියල්ලෝම හොඳ මිනිස්සු. නමුත් අද සභාපතිතුමනි, අපට කථා කරන්න වෙලා තියෙන්නේ, සියයට අනූවක්ම වැරැදි කරන දේශපාලඥයන් අතර ඉන්න හොඳ මිනිස්සු එක්කෙනෙක් දෙන්නෙක් ගැන විතරයි. මෙන්න මේ දේශපාලනයට අපි තිත තියන්න ඕනෑ. චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාට අපි ගරු කරනවා නම්, කොලොන්නාවේ විතරක් නොවෙයි. එතුමාගේ ගුණ සුවඳ හඳුනන කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව එතුමාට ගරු කරනවා නම්, කළ යුතුව තිබෙන්නේ එතුමාට දක්වන ලොකුම ගෞරවය වන්නේ ඔහු වැනි අවංක, නිවැරදි විශිෂ්ට මිනිසුන් දේශපාලන භූමිය තුළ ඉහළට ඔසවා තැබීමයි.

ඒ වාගේම මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ දරුවන් දෙදෙනාට මට යමක් කියන්න තිබෙනවා. අද මේ රටේ සමහර දේශපාලනඥයන් තමන්ගේ දරුවන්ට හොරකම් කරන්න උගන්වනවා. තමන්ගේ දරුවන්ට දූෂණ වැඩ කරන්න පොළඹවනවා. ඒවා අනුමත කරනවා. ඒවා හරිය කියනවා. එවැනි දේශපාලන පියවරුන් ඉන්න රටක තමන්ගේ ආදරණීය තාත්තා ගැන, හැබෑ ලෙසම ආඩම්බරකාර තාත්තෙක් විධියට චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා ගැන මේ දරුවන්ට ආඩම්බර වෙන්න පුළුවන්. මේ දරුවෝ යහමගට ගෙන යන්න වැරදි වැඩ කරලා හම්බ කරපු, දූෂණ කරලා හම්බ කරපු, පගා ගහලා හම්බ කරපු සතයක්වත් ඒ ආඩම්බරකාර තාත්තා වියදම් කරලා නැහැ. ඒ නිසා මේ දරුවන්ට තමන්ගේ ජීවිත කාලය තුළ එවැනි අවංක දේශපාලඥයකුගේ දරුවන් වීම ගැන මැරෙන තුරුම ආඩම්බර වෙන්න පුළුවන්. එසේ සඳහන් කරමින් අපි අදහන ආගම අනුව චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා නිර්වාණයට යන්න පෙර ඔබ වැනි අවංක මිනිසුන් මේ රට තුළ නැවත ඉපදිය යුතුයි. නැවත නැවත ඉපදී මේ සමාජය නිවැරැදි කිරීම සඳහා දායක විය යුතුයි. අවසානයේදී ඔබ නිවන් ලබා ගත යුතුයි කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, චිත්‍රා ඩයස් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක යෝජනාව ගෙනෙන මේ අවස්ථාවේ චිත්‍රා ඩයස් මැතිතුමා පිළිබඳව අපි දන්නේ දේශපාලඥයෙකුටත් එහා ගිය මනුස්සකම තුරුළු කරගත් යහපත් ගුණාංගවලින් හෙබි යුග පුරුෂයෙක් විධියට තමයි. චිත්‍රා ඩයස් මැතිතුමාගේ දේශපාලන අතීතය හඳුන්වද්දී එතුමා 1970 දේශපාලනය ආරම්භ කරපු පුද්ගලයෙක් විධියට තමයි අපේ ගරු සභා නායකතුමා මතක් කළේ. නමුත් මම මේ පිළිබඳව ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මැතිතුමාගෙන් ඇහුවාම ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මැතිතුමා ප්‍රකාශ කළේ, එතුමා ක්‍රියාකාරීව

දේශපාලනයට පිවිසෙන්නේ 1967 දී තිබුණු අතුරු මැතිවරණයෙන් කියලා. ඒ මැතිවරණයේදී විශාල කැපවීමක් වාගේම, විශාල උනන්දුවක් ගත්ත නායකයෙක් වාගේම, ඔහුට රිමාන්ඩ්ගත වෙන්නටත් සිදු වුණායි කියන එක ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මැතිතුමා ප්‍රකාශ කළා. වගකීම ගත්ත පුද්ගලයෙක් විධියට තමන්ගේ කාර්ය භාරය මැනවින් ඉටු කරන අවංක යහපත් මනුස්සයෙක් තමයි චිත්‍රා ඩයස් මැතිතුමා. දීර්ඝ කාලයක් එතුමා දේශපාලන ක්‍රියාවලියේ හිටියාට එතුමාගේ නම අහලා තිබුණාට, එතුමාගේ කටයුතු පිළිබඳව අවබෝධයක් තිබුණාට චිත්‍රා ඩයස් මැතිතුමා මට පළමුවෙන්ම හමුවන්නේ 2002 තිබුණු පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ. මම හෝමාගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට පත් වෙන කොට එතුමා කොළොන්නාව නගර සභාවේ නගරාධිපතිවරයා හැටියට පත් වෙනවා. ඒ පත් වුණාම පළාත් සභාවේ බලය තිබෙන්නේ, එතකොට වර්තමානයේ මේ බලය තිබෙන පැත්තටම තමයි. එතුමා මා නිරන්තරයෙන් හමු වුණාම අපි ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව, අණපනත්වල තිබෙන නීති රීති පිළිබඳව බොහෝ දේවල් පිළිබඳව අපව දැනුවත් කරනවා. මල්ලි, මත තියා ගන්න මීට උඩින් තියෙන්නේ අපට බලපෑම් කරන්න පුළුවන් පළාත් සභාවක්. ඒ අනුව ක්‍රියා කරද්දී බොහොම නීතියානුකූල කටයුතුවලදී නීත්‍යානුකූලවම කටයුතු කරන්න. තීන්දුවක් ගනිද්දී දෙපාරක් හිතන්න කියලා එතුමා බොහෝ විට අපට ප්‍රකාශ කරලා තිබෙනවා. පළාත් පාලන විෂය පිළිබඳව පුළුල් දැනුමක් තිබුණා වාගේම ඒ පනත පිළිබඳව ඉතාම හොඳ අවබෝධයක් තිබුණා. පනතේ වගන්ති අර්ථ නිරූපණය කරන වේලාවේදී, එතුමා ඒ පිළිබඳව සහජ හැකියාවකින් කටයුතු කළා. විවිධ අවස්ථාවන්වල කොමසාරිස්වරු ළඟ, පළාත් පාලන විෂයය භාර

[ ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා ]

ඇමැතිවරු ළඟ එතුමා මේ පනතේ අදහස් උදහස් එතුමා පරිශීලනය කරපු ආකාරයට තමන්ගේ මතය අනන්ත අප්‍රමාණව බොහෝ තැන්වල ප්‍රකාශ කරලා තිබෙනවා. එදා අපි පළමුවැනි වතාවට පළාත් පාලන මන්ත්‍රීවරු හැටියට පත්වෙලා ඔහුගේ ක්‍රියා කලාපය දිහා බලාගෙන හිටියා. ඔහු අත්දැකීම් අනුව ක්‍රියා කරන ආකාරය පිළිබඳව අපි බලාගෙන හිටියා. ඒ නිසා චිත්‍රා ඩයස් මැතිතුමා ගෞරවාන්විත දේශපාලඥයෙක් බවට දවසින් දවස පත් වුණාය කියන එක අපි ඉතාමත් ආඩම්බරයෙන් මතක් කරන්නට ඕනෑ.

මම හිතන්නේ පක්ෂයක් බැබළෙන්නේ හොඳ මිනිස්සු හින්දා. අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වගේ. මිනිස්සු නිසා පක්ෂ ගිලිහෙනවා බොහොම අඩුයි. අපි දන්න විධියට එහෙම නැහැ. නමුත් පක්ෂයක් කීර්තිමත් පක්ෂයක් බවට පරිවර්තනය වෙන්නේ ඒ පක්ෂයට හම්බ වෙලා ඉන්න යහපත් මිනිස්සු නිසා. අද පළාත් පාලන විෂයය පිළිබඳව කල්පනා කලාම කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම පළාත් පාලන විෂයය පිළිබඳව කොයිතරම් අද චෝදනා තිබෙනවාද? සභාපතිවරුන්ට චෝදනා තිබෙනවාද? සභාපතිවරු කොයිතරම් පගා ගහනවාද? අල්ලස් ගන්නවාද? දූරාචාරයට ලක් වෙලාද? නීති විරෝධී කටයුතු කොයිතරම් කරනවාද කියන එක අද දවස ගණනේ පුවත්පත්වල, රූපවාහිනී මාධ්‍යවල නිරන්තරයෙන් තිබෙනවා. පසුගිය කාලයේ දිගටම තිබුණේ, පළාත් පාලන සභාපතිවරුන්ට, ප්‍රධානීන්ට විරුද්ධව විවිධ අපචාර පිළිබඳව පුවත්. ළමා අපචාර කියයි. ස්ත්‍රී දූෂණ කියයි. අපට පසුගිය කාලයේ පළාත් පාලන මන්ත්‍රීවරු හැටියට හොඳ ගුණ යහපත්ව කටයුතු කරන සභාපතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට තමන්ගේ තිලයේ ඉන්න බැරි තත්ත්වයටම ඒක ගඳ ගස්සන ස්වභාවයක් තිබුණා. බහුතරයක් නැති වුණත්, කරන සුළුතරයේ ඉතාම දරුණු විපාක දෙන නිසාම මිනිස්සු අතර, මාධ්‍ය අතර මේ පළාත් පාලන විෂයේ ඉන්න බොහෝ දෙනෙක් ප්‍රධානීන් අගෞරවයට ලක් වෙන්න පටන් ගත්තා. මෑත කාලයේ විවිධ ප්‍රහාරවලටත් පළාත් පාලන මන්ත්‍රීවරු, ප්‍රධානීන් සම්බන්ධ වෙනවා.

දැන් උදාහරණයක් විධියට ගරු සභාපතිතුමනි, ඊයේ පෙරෙයිදා පොලිසියේ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් කියලා තිබෙනවා, උඹලා ගුටි කාලා නම් එන්න එපා. ආයුධ දෙන්නේ ආයුධ පාවිච්චි කරන්න. උණ්ඩ 20 කුත් එක්ක. ගුටි කාලා එන්න එපාය කියලා. දැන් මේ පසුගිය කාලයේ ගුටි කෑවේ කාගෙන්ද? ආණ්ඩුවේ ඉන්න පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ගෙන්. ඒ වුණාට මේ මොකක්ද කියන්නේ? සාමාන්‍ය මිනිහෙකුට ගහන්න පුළුවන්ද? ගැහුවොත් එහෙම පාංශුකූලය දෙන්න වෙන්නේ මිනිය නැතිව. ඒ නිසා එහෙම නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් කියන්නේ කා ගැනද? මේ පළාත් පාලන මන්ත්‍රීවරු පිළිබඳව පසුගිය කාලයේ ඇති වුණු යම් තත්ත්වයන් පිළිබඳව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශෝක යෝජනාවට අදාළව කථා කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ශෝක යෝජනාවට අදාළව තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉන් එහාට යන්න එපා. ශෝක යෝජනාවක් නේ ගෙනැල්ලා තිබෙන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නැති වුණු මනුස්සයාගේ ගුණ කියන්න පුළුවන් වෙන්නේ අද මේ ක්‍රියා කරන පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ තිබෙන ස්වභාවය අපි සංසන්දනය කිරීම තුළින්. අර කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි සමහර මළ ගෙවල්වල ගිහිල්ලා කථා කරන්නේ නැත්තේ ඇයි? මේ යකා රටේ තිබෙන දූෂණකම්,

වැරදි වැඩ, හොරකම්, මංකොල්ලකම්, බේබදුකම් සියල්ලම කළාම අපට ගිහිල්ලා කථා කරන්න පුළුවන්ද? හැබැයි, චිත්‍රා ඩයස් මැතිතුමා අවුරුදු ගණනාවක් පළාත් පාලන ආයතනයක ප්‍රධානියෙක් විධියට හිටියා. කිසිම දවසක කිසිම චෝදනාවක් නොමැතිව ගෞරවාන්විතව තමන්ගේ තනතුර හෙබ වූ ශ්‍රේෂ්ට නායකයෙක් කියන එක අපි මේ ශෝක ජනක අවස්ථාවේ එතුමාගේ පවුලට, දරුවන්ට ගෞරවයක් හැටියට මතක් කරන්න කැමැතියි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම දන්නේ නැහැ ඔබතුමාට මොන හිතේ අමාරුවක් ආවද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ. මට හිතේ අමාරුවක් නැහැ. ගරු විපක්‍ෂ නායකතුමා අපි ශෝක යෝජනාවක් කථා කරන කොට ඉන් එහාට යන්න අවශ්‍ය නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම කියන්නේ, අද පළාත් පාලන ප්‍රධානීන්ට තිබෙනවා කොන්ත්‍රාත් කරන්න ගියාම චෝදනා. දෙන්නේ තමන්ගේ හිතවතුන්ට. සියයට පහ ගන්නවා. ගත්තත් කමක් නැහැ, පාරට තාර දාන්නේ හරියට ආස්මීවලට පැණි දානවා වාගේ කියලා චෝදනා අනන්ත අප්‍රමාණ තිබෙනවා. ඒ අතින් බලන විට අවුරුදු ගණනාවක් තිස්සේ තමන්ගේ පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයා ලෙස කටයුතු කළා. එතුමා බොහොම හොඳට කොන්ද කෙලින් තියාගෙන කටයුතු කළා. භය නැතිව වැඩ කරන්න පුළුවන් ශක්තියක් එතුමාට තිබුණා. මම පළාත් සභාවේ විපක්‍ෂ නායකවරයා වුණාට පස්සේ මාව කිහිප අවස්ථාවක ඇවිල්ලා හමු වුණා, ඒ කොලොන්නාව නගර සභාවේ තිබුණු යම් යම් අක්‍රමිකතා පිළිබඳව. මේවා පිළිබඳව අපි කොමසාරිස්වරයා එක්ක කථා කළා. ඇත්තෙන්ම එතුමා අනවසර ඉදි කිරීම් පිළිබඳව, වැරදි විධියට සේවකයෝ ස්ථාපනය කිරීම පිළිබඳව අපි හරහා ගිහිල්ලා කොමසාරිස්වරයා එක්ක කථා කළා. කටයුතු කළා. ඒ නිසා නිවැරදිව පළාත් පාලන ආයතනයක ගමන් මඟ යහපත්ව මෙහෙයවපු ශ්‍රේෂ්ට නායකයෙකුගේ මේ ශෝකජනක අවස්ථාවේදී අපි ඇත්තෙන්ම කම්පාවට, කනගාටුවට පත් වෙනවා. මොකද, යහපත් මිනිස්සු මේ සමාජයේ අඩුකම, මද බව මේ සමාජයේ පරිහාණියට පත් වෙලා තිබෙනවා කියන එක මතක් කරනවා.

ඒ නිසා මම මීට වැඩිය දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මම හිතන්නේ ගරු සභාපතිතුමාත් කැමැති වෙයි මම කථා නොකරනවා නම්. ගරු සභාපතිතුමනි, Bat කරන්න තිබෙන වෙලාවේ හොඳම බෝල ආවාම ඒකට ගහලා දාන්න ඕනෑ. චිත්‍රා ඩයස් වාගේ මනුස්සයෙක් පිළිබඳව කථා කරන ගමන්ම අපි ඒ චරිතය ආදර්ශයට ගන්න ඕනෑ. අද වර්තමානයේ පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට අපි පොඩි උපදෙසකුත් දෙන්න ඕනෑ. ඒක තමයි මේ බලාපොරොත්තු වුණේ. ඉතින් ඒ නිසා එතුමාට අපි ගෞරව කරන්නේ ඒ විධියට. අපි හැමෝම. ඒ වාගේම තමයි එතුමා ජීවත් වුණු පරිසරය. කොලොන්නාවේ දේශපාලනය ගැන ඇහුවාම අර රේණුක පෙරේරා ආණ්ඩු පක්‍ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, හැම තැනම එහෙම තමයි කියලා. හැබැයි, හැම තැනකටම වැඩිය එතැන ඊට වඩා හාත්පසින්ම වෙනස් ස්වභාවයක් තිබෙන්නේ.

දැන් එතුමා නියෝජනය කරපු නගර සභාවේ නගරාධිපති අල්ලන්න සුදු වෑන් එකකුත් ආවා නේ? සභාපතිතුමා පැනලා දිව්වා. ඉතින් ඒකට එතුමා ඒ කාලයේත් පත්තර වාර්තා දුන්නා අනන්ත අප්‍රමාණ. පුවත්පත් වාර්තා එතුමා ප්‍රකාශ කළා. ඉතින් ඒ නිසා මම මේ කියන්නේ, ඒ වාගේ තැනක මේ යහපත් මනුස්සයෙකුගේ ගෞරවය අපි මේ සභාවේ ආරක්‍ෂා කිරීම සඳහා තමයි අද මේ වචන කීපය ප්‍රකාශ කරන්නේ. ඒ නිසා එතුමා අපේ පක්‍ෂයට හිටපු හොඳ යහපත් මනුස්සයෙක්. මේ පළාත් සභාවේ හිටපු ගෞරවාන්විත දේශපාලඥයෙක්. පළාත් පාලන ආයතනයක් කොහොමද මෙහෙය වන්නේ කියලා අද ඉන්න පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට ආදර්ශ දීපු නායකයෙක් විධියට එතුමාගේ දරුවන්ට මම හිතන්නේ ඉතාමත් ගෞරවයක් තිබෙනවා. අපේ තාත්තා මේ සමාජය තුළ කීර්තියක් උසුලපු, හොරකම් නොකරපු, වංචා නොකරපු, දූෂණයට ලක් නොවුණු ගෞරවාන්විත දේශපාලනඥයෙක් විධියට අද සමාජයේ පැසසුම් ලබනවා කියලා. නමුත් ජීවිතයේ අපි කාටත් මරණය සාදාකාලික උරුම ධර්මතාවයක්. ඒ ධර්මතාවයට එතුමා මුහුණ දුන්නා. ඒ නිසා බෞද්ධයෝ විධියට එතුමාට අමා මහ නිවන් සම්පත් ලබා ගැනීමට හේතු වාසනා වේවා කියලා ප්‍රාර්ථනය කරමින් මේ ශෝක යෝජනාවේ මගේ වචන ස්වල්පය මෙයින් සමාප්ත කරනවා.

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, අභාවප්‍රාප්ත චන්ද්‍රසිරි ඩයස් ගරු මන්ත්‍රීතුමන් පිළිබඳව ශෝක යෝජනාව ඉදිරිපත් වන මොහොතේ ඒ උත්තරීතර චරිතයට ගෞරවයක් වශයෙන් වචනයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු ඔබතුමාට මගේ ස්තුතිය ප්‍රථමව ප්‍රකාශ කරන්න කැමැතියි. මම හිතන්නේ, මේ ආණ්ඩු පක්‍ෂයේත්, විපක්‍ෂයේත් ගරු මන්ත්‍රීතුමන්ලා ඉතා පැහැදිලිව කළ ප්‍රකාශයන් අනුව අපි කාටත් පැහැදිලි වෙනවා, චිත්‍රා ඩයස් එහෙම නැත්නම් චන්ද්‍රසිරි ඩයස් අපේ ආදරණීය මන්ත්‍රීවරයා තමන්ගේ ජීවිත කාලය මොනතරම් පරමාදර්ශී ආකාරයෙන් මේ දේශපාලන භූමිකාව තුළ මෙහෙයුවාද කියන එක. මම හිතන්නේ අපි කවුරුත් තර්ක විතර්ක නොකළත් බොහෝ දෙනාගේ හෘද සාක්ෂිය මැනවින් දන්නා කාරණයක්. යහපත් මිනිසුන් කියන්නේ කාටද? මේ සමාජය අයහපත් ගති ලක්‍ෂණ ඇති, අයහපත් මිනිසුන්

කියන්නේ කාටද කියන එක පිළිබඳව කාටවත් වෙන්ව ප්‍රකාශ කරලා හඳුන්වා දීමක් කරන්න අවශ්‍යතාවයක් නැහැ. හැමෝගෙම හෘද සාක්ෂිය මේ පිළිබඳව හොඳින්ම දන්නවා. චිත්‍රා ඩයස් කියන දේශපාලන චරිතය, එහෙම නැත්නම් චන්ද්‍රසිරි ඩයස් කියන අපේ පළාත් පාලන හිටපු සභාපතිතුමා මේ පළාත් සභාව නියෝජනය කරපු ගරු මන්ත්‍රීතුමා තමන්ගේ ජීවිතය ගත කළේ මොන ආකාරයටද කියන එක පිළිබඳව අප අතරින් වෙන්ව ගිහිල්ලා, සමුගෙන ගිහිල්ලා තිබෙන මොහොතේ කථා කරන්න ලැබුණු අවස්ථාව සමාජ ශෝධනයක් සඳහා භාවිතා කරනවා. යම් කෙනෙක්, ඒක දේශපාලන අර්ථ නිරූපණයක් නොකොට තමන්ගේ සමාජයට කරන යහපතක් සේ සලකා කරනවා නම් එය උත්තරීතර ක්‍රියාවක්. නමුත් ඒ ක්‍රියාව තුළත් අපි අපේ දේශපාලන අරමුණු සාක්ෂාත් කරගන්න හදනවා නම්, ඒකත් අයහපත් ක්‍රියාවක්. ඒ නිසා මම අතිශයින්ම සන්තෝෂ වෙනවා. අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා මේ පිළිබඳව කළ විග්‍රහය පිළිබඳව. ආණ්ඩු පක්ෂයේ වෙන්න පුළුවන්. විපක්ෂයේ වෙන්න පුළුවන්. තමන්ගේ මාතෘ භූමියට ආදරය කරන, තමන් විශ්වාස කළ, තමන්ව යම් ස්ථානයකට රැගෙන ගිය මිනිස්සුන්ගේ අභිලාෂයන්ට හරස් නොවී ඔවුන්ට වංචා නොකොට, ඔවුන්ගේ බලාපොරොත්තු සුණු විසුණු නොකර යම් කෙනෙක් තමන්ගේ වගකීම නිවැරැදිව ඉෂ්ට සිද්ධ කරනවා නම් ඔහුට සමාජය තුළ හිමි විය යුතු ස්ථානය නිරන්තරයෙන්ම හිමි වන බව මේ සභාව තුළින් මැනවින් ප්‍රකාශයට පත් වුණා.

චිත්‍රා ඩයස් මැතිතුමාගේ දයාබර දරුවන් දෙන්නාට මේ රටේ ඉන්න ඉහළම කෝටිපතියාට ප්‍රදානය කරන්න බැරි තරම් වටිනා කියන දායාදයක්, වස්තුවක් ප්‍රදානය කරලා තමයි ඒ තාත්තා මිය යන්නේ. සමහර දේශපාලනඥයින්ගේ බැංකු පොත්වල කෝටි ගණන් තිබෙන්න පුළුවන්. සුවිස් බැංකුවේ තිබෙන්න පුළුවන්. වෙන වෙන බැංකුවල තිබෙන්න පුළුවන්. දරුවන් ඒවා භුක්ති

[ ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා ]

විඳිනවා වෙන්නත් පුළුවන්. හැබැයි, ඒ සියලුදෙනාම ඉතිරි කරලා යන දේට වැඩිය වටිනා යමක් චිත්‍රා ඩයස් අපේ ගරු මන්ත්‍රීතුමාට තමන්ගේ දරුවන් වෙනුවෙන් ඉතිරි කරලා යන්න පුළුවන්කම ලැබුණා. ඒක ලෙහෙසි පහසු කරුණක් නොවේ. මේ දේශපාලන භූමිකාව තුළ හැසිරෙන කොට ලැබෙන බලය සහ සම්පත් ඉතාමත් මනුෂ්‍යත්වයේ ගුණ ධර්ම තුළ ප්‍රතික්ෂේප කරමින්, ඒවා තමන්ට දුන්න මුඛ්‍ය පරමාර්ථය පිළිබඳව අවබෝධයෙන් හා හැඟීමෙන් ඒවා පරිහරණය කරන්න යම් කෙනෙකුට හැකියාවක් තිබෙනවා නම් ඒක බෝධිසත්ව ගතිගුණ ඇති අයෙකුට පමණයි කරන්න පුළුවන්. ඒක දෙකයි පනහේ මානසිකත්වයක් තිබෙන, සල්ලිවලට ගිජු, සල්ලි තිබෙනවා නම් ඕනෑම දෙයක් කරන්න පුළුවන් කියලා හිතන, සල්ලි තිබෙනවා නම් ඕනෑම සැප සම්පත් විඳින්න පුළුවන් කියලා හිතන මිනිහෙකුට කවදාවක්වත් ඒ සමස්ත ප්‍රජාවගේ මානසිකත්වය වෙනුවෙන්, හැඟීම් වෙනුවෙන් පෙනී සිටින්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි දීර්ඝ වශයෙන් පුනා පුනා නොකීවත් චිත්‍රා ඩයස් කියන්නේ බෝධිසත්ව මනුස්සයෙක්. බෝසත් ගතිගුණ ඇති කෙනෙක්. හැමෝටම වචනවලින් මේවා කථා කරන්න බොහොම පහසුයි. මේ සභාවේ ඉන්න සියලු මන්ත්‍රීතුමන්ලාට කථා කරන්න පුළුවන්. මොකද, ඔවුන් කථාවට දක්ෂ නිසා තමයි මේ තැන්වලට ඇවිල්ලා තිබෙන්නේ. කථා කරන්න දක්ෂයි. නමුත් මේ කථා කරන හැමදෙනාගේම ජීවිත තුළ මේවා කොපමණ ඇතුළත් වෙලා තිබෙනවාද කියන එක තමයි අපි පෞද්ගලිකව බලන්න ඕනෑ. ඒක අපට වැඩිය හොඳින් දන්නේ මහජනතාව.

ගරු සභාපතිතුමනි, අපට ඕනෑ දෙයක් මෙතැන කියන්න පුළුවන්. ඒවා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙනවා. නමුත් මේවා ගමේ ගොඩේ ගිහිල්ලා කථා කරන කොට ගමේ ගොඩේ ඉන්න මනුස්සයා තමයි මේ කථා කරන අයගේ ප්‍රමාණය හරියටම දන්නේ. ඒ නිසා චිත්‍රා ඩයස් කියන්නේ, යථාර්ථවාදීව මනුෂ්‍යත්වය තුළ මුදුන් පෙත්තටම නැගපු සැබෑ මනුෂ්‍යයෙක්. දිගින් දිගට කථා නොකළත්, ඔහු ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයකු නොවුණාට, ඔහු වාමාංශිකයකු නොවුණාට, ඔහු දක්ෂිණාංශිකයකු නොවුණාට, මේ රටේ බිහි වුණු යම් දේශපාලන පරපුරක ඉතාමත් ශ්‍රේෂ්ට කොටස්කරුවකු කියන එක අවිවාදාත්මකව ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් ඉතා හොඳින් පිළිගත්තා. ඒ නිසා ඊට වැඩිය ගෞරවයක් මිනිහෙකුට ජීවිතයේ අවශ්‍ය නැහැ. මේ උපන් අපි හැමෝම මැරෙනවා. මරණයත් එක්කම තමයි අපි ජීවිතය අරගෙන ආවේ. එක එක කාල වකවානුවලට එක එක සම්පත් ලැබෙනවා. බලය ලැබෙනවා. ඒ බලය ලැබුණාම මැරෙනවාය කියලා අමතක වෙනවා. වයසට යනවාය කියලා අමතක වෙනවා. අන්තිමට ගෙදර පුංචි කාමරයක තමන්ට ඉතිරි වෙන්නේ පිස් පෝච්චියයි. පඩික්කමයි. සැරයටියයි. ඔය ටික විතරයි ඉතිරි වෙන්නේ. මේ කිසිම සැප සම්පත්වලින්, බලයෙන්, ශක්තියෙන් ප්‍රයෝජනයක් නැති දවසක් එනවාය කියලා දැනෙන්නේ නැහැ. එහෙම ලෝකයක චිත්‍රා ඩයස් වැනි දේශපාලඥයින් මේ සමාජයට ඉතිරි කරලා ගිය ඒ ශ්‍රේෂ්ට උදාර ගතිපැවතුම් සදා කාලයෙන් සදා කාලයටම මේ රටේ ජීවත් වන සමස්ථ දේශපාලඥයින්ට ආදර්ශයක්ම වේවායි කියලා ප්‍රාර්ථනා කරමින්, මගේ දයාබර මිත්‍රයාට නිවන් සුව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ඉතාමත් කෙටියෙන් අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාට අපි චිත්‍රා අයියා කියලා කියන්නේ. තෙවන පළාත් සභාවේ අපත් සමඟ එකට වාඩි වෙලා අපත් සමග හිටපු ගරු මන්ත්‍රීවරයකුගේ ශෝක ප්‍රකාශ යෝජනාව සම්බන්ධව කථා කරන්න ලැබීම සතුටට කරුණක්. මම දකිනවා, මගේ පළාත් සභා ඉතිහාසයේ මන්ත්‍රීවරයකුගේ අභාවයකදී වැඩිම මන්ත්‍රීවරු පිරිසක් කථා කරපු අවස්ථාව වෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා විශාල ප්‍රමාණයක් කථා කළා. උදාහරණයක් වශයෙන් අපේ අමාත්‍යතුමා පවා කථා කළා.

ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා පවා කථා කළා. එහෙම නම් මේ මන්ත්‍රීතුමා සම්බන්ධයෙන් යම්කිසි අරුතක් තිබෙනවා. එම නිසා තමයි අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාත් දීර්ඝ වශයෙන් කථා කළේ. එයට පිළිතුරු දෙමින් අපේ විපක්ෂ නායකතුමාත් දීර්ඝ වශයෙන් මන්ත්‍රීතුමාව සම්බන්ධ කර ගෙන කථා කළේ.

ඇත්තටම අද අපි දකිනවා ගරු සභාපතිතුමනි, චිත්‍රා ඩයස් මැතිතුමාගේ මෙම ශෝක යෝජනාවේදී විශේෂ සිදුවීම් ගණනාවක් වුණා. වැඩිම මන්ත්‍රීවරුන් පිරිසක් කථා කළා. විපක්ෂයේ මන්ත්‍රීවරයකුට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කථා කළා. ඇමතිවරු කථා කළා. සංවිධායකවරු කථා කළා වාගේම මෙම ශෝක යෝජනා අවස්ථාවටත් අපේ හිටපු කැබිනට් අමාත්‍ය ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මැතිතුමා. අපේ එක්සත් ජාතික පක්ෂයේ කොලොන්නාවේ සංවිධායකතුමාත් සහභාගී වුණා. ගැලරියට ඇවිල්ලා මේ යෝජනාව ශ්‍රවණය කරන්න, සම්බන්ධ වෙන්න අවස්ථාව උදා කර ගත්තා. ඉතින් ඒ අවස්ථාව ලැබීමත් අපි අගය කරන්න ඕනෑ. ඒ නිසා එවැනි තත්ත්වයට අද පළාත් සභාවේදී මෙම මන්ත්‍රීතුමාගේ යෝජනාව පත් වුණා. ගරු මන්ත්‍රීවරු අපේ මන්ත්‍රීතුමා සම්බන්ධව දීර්ඝ වශයෙන් කථා කළා.

ගරු සභාපතිතුමනි, අපි දන්නවා බස්නාහිර පළාත් සභාවේ අයවැය විවාදවලදී පළාත් පාලන විෂය සම්බන්ධව කථා කරද්දී පළමුවෙන්ම අපේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාත්, චිත්‍රා ඩයස් ගරු මන්ත්‍රීතුමාත් අදහස් දක්වමින් කටයුතු කරපු ආකාරය අපි දන්නවා. පළාත් පාලන ක්ෂේත්‍රයේ නගර සභාව වෙන්න පුළුවන්. ප්‍රාදේශීය සභාව වෙන්න පුළුවන්. ඒ සියල්ල සම්බන්ධව ඉතා දීර්ඝ වශයෙන් අදහස් දක්වනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා අමාත්‍ය ධූරය දරන එම වැය ශීර්ෂයේදී දීර්ඝ වශයෙන් අදහස් උදහස් කථා කරපු ආකාරය අපි දුටුවා. ඒ අයවැය විවාද තුළින් කථා කරපු දේවල් අද ක්‍රියාත්මක වෙනවා. එහෙම නම් ඒ තුළින් අද ප්‍රයෝජනයක් ලැබිලා තිබෙනවා. මේ චිත්‍රා අයියා වෙනුවෙන්. එහෙම නම් චිත්‍රා ඩයස් හිටපු ගරු මන්ත්‍රීතුමා අපේ පළාත් සභාවට සේවාවක් කරලා තිබෙනවා කියන එක අපි කවුරුත් දන්නවා. නගර සභාවෙන් පළාත් සභාවට ඇවිල්ලා, අද පළාත් සභාවේදී ශෝක යෝජනාවක් තුළින් එතුමා ගැන කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධවත් ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පේ, මණ්ඩාවල ප්‍රදේශයේ තමයි එතුමා පදිංචි වුණේ. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව නගර සභාවේ නගරාධිපති වෙලා කොලොන්නාවත්, ඒ කොළඹ දිස්ත්‍රික්කයත්, ගම්පහ දිස්ත්‍රික්කයත් යාබද වන ආකාරයෙන් ඒ කියන්නේ කැළණි ගඟෙන් එහා පැත්තේ ඉඳන් දේශපාලනය කරපු මන්ත්‍රීවරයෙක් ඉන්නවා නම් ඒ චිත්‍රා ඩයස් මැතිතුමා බව අපි අවංකව කියන්න ඕනෑ. අපි දන්නවා දේශපාලනයේදී එතුමා හම්බ කරලා නැහැ. දේශපාලනයේදී එතුමා හම්බ කරලා තිබෙන්නේ ජනතාව විතරයි. එම නිසා තමයි පළාත් සභාවට ඕනෑ නම් පළාත් සභාවට යන්න පුළුවන්. නගර සභාවට ඕනෑ නම් නගර සභාවට යන්න පුළුවන්. ඕනෑ නම් නගරාධිපති වෙන්න පුළුවන්. ඕනෑ නම් පළාත් සභා මන්ත්‍රීවරයෙක් වෙන්න පුළුවන් තත්ත්වයට එතුමා ජනතාව තුළ හිටියා. එම නිසා තමයි එදා එතුමා අවසන් ගමන් යන දවසේදී කොලොන්නාවේ මොන තරම් ජනතාවක් එදා ඒ අවස්ථාවට සහභාගී වුණාද කියලා අපි දැක්කා. අන්තිම මැත වකවානුවලදී අපේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයට එතුමා කිහිප අවස්ථාවක් ආවා. අපේ විපක්ෂ නායකතුමා හමු වෙන්න. ඒ කොලොන්නාවේ නගර සභාවේ යම් යම් ප්‍රශ්න පිළිබඳව. ඒ අවස්ථාවේ මමත් හිටියා. සේවකයන්ගේ ප්‍රශ්න. එතුමා නගරාධිපති වෙලා ඉන්න වෙලාවේදී ගත්ත සේවකයන් අද ඉවත් කිරීම නිසා යම් යම් ප්‍රශ්න මතු වෙලා මෙතුමා අපේ විපක්ෂ නායකතුමා හමුවෙලා පළාත් පාලන කොමසාරිස්තුමියට කථා කරලා ඒ ප්‍රශ්න විසඳපු ආකාරය අපි දකිනවා. ඒ විතරක් නොවෙයි. එතුමන්ලාගේම පවුලේම කෙනෙකුගේ, සෞඛ්‍ය සේවාවේ මට මතක විදියට – මමත් ඒ ස්ථානයේ හිටියා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මාරු වීමක් සම්බන්ධව අපේ විපක්ෂ නායකතුමා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාට කථා කරලා, ඒ වෙලාවේම ඒ මාරු වීම ලබා දුන්න ආකාරයත් අපි දකිනවා. මෙතුමා අප අතරින් වෙන් වෙන්න දවස් දෙක තුනකට පෙර. එම නිසා එතුමා ඇත්තටම හම්බ කර ගෙන ඉන්නේ ජනතාව විතරයි. එම නිසා මම දීර්ඝ වශයෙන් අදහස් ප්‍රකාශ කරන්නේ නැහැ. එහෙම නම් අපේ එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාගේත්, අපේ පක්ෂයේ සියලුම සංවිධානවල ශෝකයත් පිරිනමමින්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී දිවංගත එස්. චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමේ යෝජනාවට අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාව මෙයින් අවසන් වෙනවා. එතුමා වෙනුවෙන් ශෝකය පළ කරමින් අදහස් දැක්වූ සියලුම මන්ත්‍රීවරුන්ට මම මේ අවස්ථාවේදී මගේ ප්‍රණාමය පුද කර සිටිනවා. විපක්ෂ නායකතුමා එක්ක මමත් එකඟ වෙනවා. ඇත්ත වශයෙන් විපක්ෂ නායකතුමාගේ කථාවේදී මම එතුමාට පොඩි අවවාදයක් ලබා දුන්නේ, එතුමා මාතෘකාවෙන් පිට පොඩ්ඩක් යන්න ගිය නිසයි. එතුමාගේ කථාවට මම එකඟයි. ඒ වාගේම කීර්ති උඩවත්ත මැතිතුමා එක්කත් මම එකඟයි. එතුමා බොහොම හරවත් කථාවක් කළා. වර්තමාන දේශපාලන තත්ත්වය පිළිබඳව. මම හිතන්නේ ඒ කථා දෙකම කළේ, චන්ද්‍රසිරි ඩයස් මැතිතුමාගේ හරි දේ පිළිබඳව තව තවත් උලුප්පා දක්වන්නයි. උද්දීපනය කරන්නයි. නැතිව මගේ මතයක් නොවෙයි ඒක. මමත් එකඟ වෙනවා.

චන්ද්‍රසිරි ඩයස් මැතිතුමා තෙවන පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරයකු වශයෙන් මගෙත් එක්කත් අවුරුදු පහක කාලයක් කටයුතු කළා. මම දන්න විධියට. මම දැකලා තිබෙනවා. සව්සිරිපායේදී තමයි අපි එකට හිටියේ පසුපෙළ මන්ත්‍රීවරු වශයෙන්. එතුමා දක්ෂ කථිකයෙක්. හරවත් කථිකයෙක් එතුමා. එතුමා දක්ෂ ලෙස සභාවේ විවාදවලට සම්බන්ධ වුණා. ඒත් එක්කම එතුමා පළාත් පාලන ක්ෂේත්‍රය තුළ දක්ෂ නගරාධිපතිවරයෙක්. ජනතාව අතර ඉතාම ජනප්‍රිය නගරාධිපතිවරයකු වශයෙන් කොළොන්නාව වාගේ ආසනයක, ප්‍රදේශයක ඒ කටයුතු කිරීමත් අපි අගය කරන්නට ඕනෑ. ඒ නිසා එතුමාගේ අභාවය මම හිතන්නේ, ඒ ආදරණීය දුවට, පුතාට, ඒ පවුලේ අයට වාගේම විශේෂයෙන් පළාත් පාලන ක්ෂේත්‍රයට විශාල පාඩුවක්. මොකද, එතුමා මේ පළාත් පාලන ක්ෂේත්‍රය තුළ හිටපු දක්ෂතම, ඉතාමත් බුද්ධිමත් නගරාධිපතිවරයෙක්. පළාත් සභාව තුළ එතුමා අවුරුදු පහක් කටයුතු කළා. ඒ කාලය තුළ එතුමා පළාත් සභාවට යම්කිසි හරවත් දෙයක් ලබා දෙන්න දැඩි උත්සාහයක් ගත්තා. අර සිරිකමල් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ යම්කිසි කළකිරීමක් එතුමාගේ තිබෙන්න ඇති. ඒක මම දන්නේ නැහැ. මොකද, පළාත් සභා ක්‍රමය පිළිබඳව. ඒ නිසා එතුමාගේ අභාවය අපි හැම දෙනාටම වාගේ විශාල පාඩුවක්. මම මේ අවස්ථාවේ දීර්ඝ වශයෙන් අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මම මේ අවස්ථාවේදී මගේ පවුලේ ශෝකය සහ මගේ පෞද්ගලික ශෝකය දිවංගත චන්ද්‍රසිරි ඩයස්, අපේ චිත්‍රා ඩයස් මැතිතුමා පිළිබඳව, ඒ මැතිතුමාගේ දයාබර දුවටත්, පුතාටත් ඒ ඥාතීන්ටත් ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා සභා ගර්භය තුළ නොසිටියත් එතුමාගේ යුගයේත් පළාත් සභාව නියෝජනය කළ මන්ත්‍රීවරයකු තමයි අපේ හිතවත් ආදරණීය චිත්‍රා ඩයස් මැතිතුමා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම අමාත්‍යවරුන්ගේ ශෝකයත්. [ ගරු සභාපතිතුමා ]

ජගත් අංගගේ ගරු අමාත්‍යතුමා අදහස් ප්‍රකාශ කළා. ශෝකය පළ කළා. කොඩිකාර අමාත්‍යතුමාත් සභා ගර්භය තුළ සිටිනවා. ඒ හැම අමාත්‍යවරයකුගේ මෙන්ම අදහස් ප්‍රකාශ නොකරපු සෑම මන්ත්‍රීවරුන්ගේම ශෝකය ඒ ආදරණීය දුවට, පුතාට සහ පවුලේ ඥාතීන්ට මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම සභාවේදී අදහස් දක්වපු ශෝක ප්‍රකාශ යෝජනාව වෙනුවෙන් අදහස් ප්‍රකාශ කරපු ඒ සියලුම කථා ඇතුළත් හැන්සාඩ් වාර්තාවල පිටපතක් ඒ පවුලේ ඥාතීන්ට ලැබෙන්නට සලස්වන ලෙස මම මේ අවස්ථාවේදී ලේකම්තුමාට උපදෙස් දෙනවා. අවසාන වශයෙන් පළාත් පාලන ක්ෂේත්‍රය තුළ අමිල මෙහෙවරක් කරපු ශ්‍රේෂ්ට පුරුෂයකුගේ අභාවය වෙනුවෙන් අපි කවුරුත් ප්‍රාර්ථනා කරන අති උතුම් නිවන් සුව එතුමාට අත් වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

# කල් තැබීමේ යෝජනාව
# ADJOURNMENT

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතු"* යැයි යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.59 ට, 2013 මැයි මස 21 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 12.59 p.m till 9.30 a.m. on 21.05.2013*